ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

காணி சீர்திருத்த ஆணைக்குழு

Land Reform Commission

සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය

சுற்றுலா மற்றும் காணி அமைச்சு

Ministry of Tourism and Land

වාර්ෂික වාර්තාව

ஆண்டறிக்கை

Annual Report

2023

011 2 144 795 FAX 011 2 878 052

www.lrc.gov.lk අංක 475, කඩුවෙල පාර, බත්තරමුල්ල chairman@lrc.gov.lk

සභාපතිතුමාගේ පණිවුඩය

දශක පහක කාලයකට වඩා ඉතිහාසයක් ඇති ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, මේ මහ පොළොව පොදු ජාතික සම්පතක් ලෙස පරිහරණය කිරීමේ වැඩපිළිවෙලක් සැකසීමේ ආරම්භය ලෙස එවකට කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යවර දිවංගත හෙක්ටර් කොබ්බෑකඩුව මැතිතුමන් තම නිල බලයෙන් රජයේ නියම උරුමකරුවන් වෙත තම අයිතිය ලබාදීමේ අරමුණෙන් 1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ පනත මඟින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව පිහිටුවන ලදී.

යටත් විජිත යුගයෙන් පසුව වුවද ලාංකීක ජනතාව මුඩු බිම් පනත් වැනි නීතිමය බැඳීම් වලින් ඉඩම් අක්කර ලක්ෂ ගණනින් ඉඩමේ අයිතිය හුවමාරු වෙද්දී, ඒ පිළිබඳ ඉඩම් ප්‍රතිපත්ති වෙනස් කිරීමේ අවශ්‍යතාවයද, දෙවන ලෝක යුද්ධය පසුව ඇති වූ ලෝක ආර්ථික පරිහානියෙන් ශ්‍රී ලංකාවට බලපෑ සමාජ පීඩනය තව තවත් උග්‍ර වූ එදා අප රට එක පැත්තකින් සාගින්නත්, අනෙක් පසින් රැකී-රක්ෂා හිඟයත් සහ එම කාරණා දෙකටම හේතු වූ ඉඩම් හිඟයත් ඉතා බරපතල ප්‍රශ්න ලෙස මේ ශ්‍රී ලංකා භූමිය තුළ මතු වෙද්දී ඒ සඳහා විසඳුම් ලෙසද මේ ප්‍රගතිශීලි පනත හැඳින්විය හැක.

භූමියේ අසමතුලිත ලෙස තිබූ පෞද්ගලික අයිතිය අහෝසි කර මේ මහ පොළොව පොදු ජාතික සම්පතක් ලෙස පරිහරණය කිරීමේ වැඩ පිළිවෙලක් සැකසීමේ ආරම්භය ලෙස පුද්ගලික ඉඩම් අයිතිය සීමා කර ඉඩම් ප්‍රතිසංස්කරණ පනත හරහා ශ්‍රී ලංකාවේ සංවර්ධන අරමුණු වෙත ඉතා ඵලදායී අයුරින් සාක්ෂාත් කර ගැනීමේ අභිලාෂයෙන් වර්තමානය තෙක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව ක්‍රියාකරමින් සිටී.

එවන්, පරමාර්ථ හා අරමුණු පෙරදැරිව ආරම්භ කළ මෙම ආයතන පනතේ අරමුණු ලභා කර ගැනීම වෙනුවෙන් රටේ කෘෂි ආර්ථිකය සහ නිෂ්පාදන ආර්ථිකය උත්ප්‍රේරණය සඳහා ප්‍රමුඛතම අත්වැල සපයමින් ජාතික සංවර්ධන කාර්යයට උරදෙමින් සිටී.

එපමණක් නොව උපන් භූමිය මත හිමිකමක් නොමැති පුරවැසියන් වෙත ඉඩමක නීත්‍යානුකූල අයිතිය ලබා දෙමින්, රැකී රක්ෂා බිහි කරමින් සෘජු සහ වක්‍ර ජනතාවාදී අපේක්ෂාවන් ඉටු කිරීම වෙනුවෙන් ඉතා විශාල සේවයක් රට වෙනුවෙන් ඉටු කිරීම ද මෙහිදී සිහිපත් කළ යුතුමය.

කොමිෂන් සභාවේ මූලික වගකීම් ලෙස ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතේ විධි විධාන සහ කලින් කලට රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණ අනුව, කොමිෂන් සභාවේ ඉඩම් හිමියන්ගේ ව්‍යවස්ථාපිත බැඳීම් නිදහස් කිරීම සහ ඔවුනට වන්දි ගෙවීම, ඵලදායී අයෝජනයන් සඳහා ඉඩම් පැවරීම සහ කොමිෂන් සභාවේ ආදායම එකතු කිරීම, ඉඩම් ආරක්ෂා කිරීම සහ කාර්ය මණ්ඩලයේ පුහුණුව සහ සුභ සාධනය සිදු කරනු ලබන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව තම ගැටළු සහ කාලීන අවශ්‍යතා සඳහා ස්ථිරසාර විසඳුම් ලබාදීමට "වාර්ෂික වාර්තා - 2023" ක්‍රියාත්මක කරන ලදී.

නීතීඥ පණ්ඩුක කීර්තිනන්ද
සභාපති | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

පටුන

1.	ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය	1
	1.1 හැඳින්වීම	1
	1.2 දැක්ම, මෙහෙවර සහ අරමුණු	2
	1.2.1 දැක්ම	2
	1.2.2 මෙහෙවර	2
	1.2.3 අරමුණු	2
	1.3 කාර්යභාරය, ආයතන ස්ථාපනය, කොමිෂන් සභාවේ සංයුතිය සහ නීතිමය බලය හා කාර්යයන් පිළිබඳ පනත්	2
	1.3.1 කාර්යයන්	2
	1.3.2 ආයතනය ස්ථාපනය	3
	1.3.3 කොමිෂන් සභාවේ සංයුතිය	3
	1.3.4 නීතිමය බලය හා කාර්යයන් පිළිබඳ පනත්	3
	1.4 සංවිධාන සැලැස්ම	4
	1.5 අංශ සහ දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩල	5
	1.5.1 ප්‍රධාන අංශයන්	5
	1.5.2 දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩල	5-6
2.	ප්‍රගතිය හා ඉදිරි දැක්ම	7
	2.1 කළමනාකරණ හා මානව සම්පත් සංවර්ධන අංශය	7
	2.1.1 ආයතනික කටයුතු	7
	2.2 ඉඩම් අංශය	8
	2.2.1 ඉඩම් පැවරීම් අංශය	8
	2.2.2. ව්‍යාපෘති අංශය	8
	2.2.3 ඉඩම් උපරිම සීමා අංශය	9
	2.2.4 රාජ්‍ය ආයතන අංශය	9
	2.3 නීති අංශය	10
	2.4 අභ්‍යන්තර විගණක අංශය	10
	2.4.1 විගණනය සඳහා බලය	10
	2.4.2 වසර තුල ඉටු කරන ලද රාජකාරී	11
3.	2023 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්ය සාධනය (ඇමුණුම 01)	12
	3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති හඳුන්වාදීම.	12
	3.1.1 ආයතනික තොරතුරු	12-13
	3.1.2 සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති	13-20
	3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	21-22
	3.3 විස්තීරණ ආදායම් ප්‍රකාශය	23
	3.4 මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය	24-25
	3.5 ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය	26
	3.6 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	27
4.	විගණකාධිපතිවරයාගේ වාර්තාව	28
5.	කාර්ය සාධන දර්ශක	29
	5.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)	29
6.	තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය	30
	6.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු	20
7.	මානව සම්පත් පැතිකඩ	31
	7.1 සේවක සංඛ්‍යා කළමනාකරණය	31
	7.2 මානව සම්පත් සංවර්ධනය	32-33
8.	අනුකූලතා වාර්තාව	34-40

1. ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

1975 අංක 39 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ (සංශෝධන) පනත, 1981 අංක 14 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ (සංශෝධන) පනත, 1981 අංක 39 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනත, 1986 අංක 14 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනත සහ 1986 අංක 18 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත වන පනත් මඟින් සංශෝධනය වූ 1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ පනතෙන් ස්ථාපිත වූ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අඩ සියවසක් ඉක්මවා යන ඉතිහාසයකට හිමිකම් කියනු ලැබේ.

අවුරුදු 50 ක් පුරා කොමිෂන් සභාවේ කාර්යභාරය ඉඩම් ප්‍රතිසංස්කරණ පනතෙන් ලැබී තිබූ ප්‍රතිපාදන මෙන්ම, රජය විසින් වරින්වර ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයන් මත මෙහෙයවමින් පවතී. ඉඩම් පවරා දුන් ප්‍රකාශකයින්ගේ නීතිමය බැඳීම් ලබාදීම මෙන්ම ඔවුනට වන්දි මුදල් ගෙවීම, පවරාගත් ඉඩම් ඵලදායී ආයෝජන වලට යෙදවීම කොමිෂන් සභාවට ලැබිය යුතු ආදායම රැස්කිරීම හා ඉඩම් ආරක්ෂා කිරීම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ප්‍රමුඛ කාර්යයන් වේ.

එසේම, වර්තමාන ශ්‍රී ලංකික ආර්ථික ගමන් මඟ සාර්ථක කරමින්, රජයේ අරමුණු හා ප්‍රතිපත්ති අනුව ඉඩම් කැබලි වැඩි ප්‍රමාණයක් මහජනයා අතරේ බෙදාදීමේ වැඩපිළිවෙල යටතේ, එකී කටයුතු සාර්ථක කර ගැනීම ඉලක්ක කර ගනිමින් කොමිෂන් සභාවේ කටයුතු මෙහෙයවීමට අරමුණු කොට ඇත.

2023 වසර තුල පහත සඳහන් ප්‍රමුඛතාවයන් විශේෂයෙන්ම හඳුනා ගැනීමට කටයුතු කර ඇත.

i. කොමිෂන් සභාව සතු හඳුනා නොගත් ඉඩම් හඳුනා ගැනීම

ii. ඵලදායී නොවන ආයෝජන වලට පවරන ලද ඉඩම් ආපසු ලබා ගැනීම

iii. "සැමට හිමි බිමක්" වැඩපිළිවෙල යටතේ කොමිෂන් සභාව සතු බෙදාදිය හැකි ඉඩම් බෙදාදීමට කඩිනම් වැඩපිළිවෙළක් සකස් කිරීම මෙන්ම මෙතෙක් බෙදා දී තිබූ ඉඩම් සඳහා පදිංචිකරුවන් නියමානුකූල කිරීමේ වැඩසටහන නව මුහුණුවරක් දී ජාතික කර්තව්‍යයක් ලෙස ඉඩම් ඔප්පු බෙදාදීමේ වැඩසටහන ක්‍රියාත්මක කරවීම

iv. ආදායම් වැඩිකිරීමේ වැඩසටහන්

   අ) කෘෂිකාර්මික හා කාර්මික ව්‍යාපෘතියන් සඳහා ලබාදී ඇති බදු ඉඩම් වලින් බදු මුදල් නිසි පරිදි අයකර ගැනීම.

   ආ) රජය විසින් අත්කර ගත් ඉඩම් සඳහා වන්දි මුදල් ලබා ගැනීම

   ඇ) රාජ්‍ය ආයතන වලට පවරන ලද ඉඩම් වෙනුවෙන් ආදායම් ලබා ගැනීම

   ඉ) බදු පදනම මත පුද්ගලයන්ට පවරන ලද ඉඩම් සඳහා මෙතෙක් අයකර ගැනීමට නොහැකි වූ බදු මුදල් අයකර ගැනීමට ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කිරීම

   උ) බණිජ සම්පත් ආශ්‍රිත ආර්ථික ව්‍යාපෘති වලින් ආදායම් රැස්කිරීම

ආයතනයේ මෙම කාර්යභාරය පිළිබඳ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම හා නිලධාරීන්ගේ අදහස් හා යෝජනා ලබා ගැනීම සඳහා ආයතනයේ සියළුම නිලධාරීන්ගෙන් සමන්විත එක් එක් කාර්යයන් සඳහා කමිටු පත්කිරීම හා වැඩමුළු පැවැත්වීම ද ආරම්භ කරන ලදී. එමෙන්ම කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම සිදුකරන ලදී.

රජයේ ප්‍රතිපත්ති වලට අදාලව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ කාර්යභාරය මෙහෙයවීමට හා කඩිනමින් ක්‍රියාත්මක කරවීම ඉතා කාලෝචිත පියවරක් ලෙස සලකා නිරතුරුවම සාකච්ඡා පවත්වා අවශ්‍ය තීරණ හා එකී තීරණ ක්‍රියාත්මක කිරීම පසුවිපරම් කිරීමද සිදුකරමින් පවතී. තවද, මහජනයාගේ විවිධ ගැටළු සම්බන්ධයෙන් ඔවුන් කැඳවා පත්කල කමිටු මඟින් සෘජු සාකච්ඡාවන් පවත්වා කඩිනම් තීරණ ගැනීම ද සිදු වී ඇත.

මීට අමතරව එලදායී ආයෝජන හඳුනාගෙන ඒ සඳහා ඉඩම් ලබාදීමට ගරු ඇමතිතුමාගේ උපදෙස් මත විශේෂඥ දැනුම ඇති උපදේශක කමිටු නිර්දේශය මත ක්‍රියා කිරීම ද සිදු කරමින් පවතී.

තවද, ගරු ඉඩම් අමාත්‍යතුමන්ගේ සහ අමාත්‍යාංශ ලේකම්තුමන්ගේ මෙහෙයවීම උපදෙස් සහ මඟ පෙන්වීම මත ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙතින් පවරා ගත් ඉඩම් සම්පත ආයතනයේ ප්‍රගතිය පමණක් නොව රටේ ආර්ථික හා සමාජ සංවර්ධනයට දායකත්වය ලබාදීමට ද කටයුතු කර ඇත.

1.2 දැක්ම, මෙහෙවර සහ අරමුණු

1.2.1 දැක්ම

ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ පැවරුණු ඉඩම් සහ භෞතික සම්පත් ජනතාවගේ සහ දේශයේ සමෘද්ධිය උදෙසා මෙහෙයවීමේ ප්‍රමුඛතම ආයතනය බවට පත්කිරීම.

1.2.2 මෙහෙවර

ඉඩම් ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය සහ උපරියට වැඩි ඉඩම් ජාතියේ යහපත උදෙසා එලදායිතාවය ඉහළ නංවමින් ද භෞතික සම්පතෙහි අයිතිය සුරක්ෂිත කොට පාලනය කරමින් ද, ඉඩම් උපරිමය කලානුරූපව බලාත්මක කරමින් ද, නියමානුකූලව වන්දි ගෙවීම හා ආර්ථික කටයුතු වල ආයෝජනය කරමින් ද, අනාගත පරපුරේ අභිවෘද්ධිය උදෙසා භාවිතා කල හැකි ඉඩම් සංචිතයක් පවත්වා ගෙන යමින් ජාතික සංවර්ධනයට ක්‍රියාකාරී ලෙස දායක වීම.

1.2.3 අරමුණු

i. උපරිමයට වැඩි කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණයක් කිසිම තැනැත්තකු විසින් අයිතිව තබා නොගැනීම සුරක්ෂිත කිරීම

සහ

ii. යම් තැනැත්තෙකුට අයිති උපරිමයට වැඩි කෘෂිකාර්මික ඉඩම් පවරා ගැනීම හා ඒ ඉඩම්වල නිෂ්පාදනය සහ ඒ ඉඩම් වලින් ඇති වන රැකී රක්ෂා ප්‍රමාණය වැඩිවීමේ ප්‍රතිඵලය ගෙනදෙන ක්‍රමයකට ඒවා ප්‍රයෝජනයට ගැනීම.

1.3 කාර්යභාරය, ආයතන ස්ථාපනය, කොමිෂන් සභාවේ සංයුතිය සහ නීතිමය බලය හා කාර්යයන් පිළිබඳ පනත්

1.3.1 කාර්යයන්

1. ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ විධිවිධානයන්ට අනුව පුද්ගලයෙකුට තබා ගත හැකි උපරිම ඉඩම් ප්‍රමාණය නීත්‍යානුකූල කිරීම.
2. උපරිමයට වැඩි ඉඩම් හඳුනාගෙන කොමිෂන් සභාව සතු කර ගැනීම.
3. පනතින් ලැබී ඇති ප්‍රතිපාදන අනුව නීතිමය බැඳීම් නිදහස් කිරීම.
4. කොමිෂන් සභාව සතු කර ගන්නා ලද ඉඩම් වෙනුවෙන් ප්‍රකාශකයින්ට වන්දි මුදල් ගෙවීම.
5. පවරා ගෙන ඇති නමුත් පනතින් බැහැර වන ඉඩම් ආපසු ලබාදීමට කටයුතු කිරීම.
6. ඉඩම් ලේඛනය යාවත්කාලීන කරමින් ක්ෂේත්‍රය හා සම්බන්ධ වී ඉඩම් තොරතුරු ඒකරාශි කිරීම.

7. රටේ ආර්ථික සංවර්ධනයට දායකත්වය ලබාදීම.
8. රටේ සමාජ සංවර්ධනයට ඉඩම් දායකත්වය ලබාදීම.
9. ආදායම් රැස්කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
10. ආයතනික සංවිධානය ශක්තිමත්ව ක්‍රියාත්මක කිරීම.
11. පුහුණු හා කාර්යක්ෂම කාර්ය මණ්ඩලයක් ඇති කරලීම.
12. ආයතනික ඵලදායිතාවය වැඩි දියුණු කිරීමට අවශ්‍ය භෞතික සම්පත් හා පහසුකම් සලසා දීම.

1.3.2 ආයතනය ස්ථාපනය

1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත මඟින් පිහිටුවා ඇත.

1.3.3 කොමිෂන් සභාවේ සංයුතිය

1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ පනත 45 වගන්තිය අනුව පිහිටුවන ලද ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සංයුතිය මෙසේය.

i.	ගරු විෂය භාර ඇමතිතුමා විසින් පත් කරනු ලබන	-	සභාපති
ii.	ගරු විෂය භාර ඇමතිතුමා විසින් පත් කරනු ලබන සාමාජිකයින්	-	05
iii.	නිල බලයෙන් පත් කරනු ලබන සාමාජිකයින්	-	03

කොමිෂන් සභාවේ කාර්යයන් ක්‍රියාවට නැංවීමෙහිලා උපයෝගී කරගනු ලබනුයේ මෙම කොමිෂන් සභා මණ්ඩලය මඟින් ගනු ලබන තීරණ හා අනුමැතියන් වන අතර, එක් එක් කාර්යයට කොමිෂන් සභා මණ්ඩලයේ අනුමැතිය ලබා ගනු ලැබේ. 1972 වර්ෂයේ සිට 2022.12.31 දින දක්වා කොමිෂන් සභා මණ්ඩල රැස්වීම් 783 ක් පවත්වා ඇත.


1.3.4 නීතිමය බලය හා කාර්යයන් පිළිබඳ පනත්

i. 1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ පනත
ii. 1975 අංක 39 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ (සංශෝධන) පනත
iii. 1981 අංක 14 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ (සංශෝධන) පනත
iv. 1981 අංක 39 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනත
v. 1986 අංක 14 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනත
vi. 1986 අංක 18 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

අංක (i) හා (ii) පනත් අනුව, දේශීය ප්‍රකාශකයින්ගෙන්, රන් පවුම් සමාගම් වලින් හා රුපියල් සමාගම් වලින් ඉඩම් අක්කර: 1,809,495 රූඩ්: 3 පර්: 3.74 ක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇත. ඉහත අංක (i) හා (ii) පනත් සම්බන්ධව,

i. සංශෝධනයන් - අංක iii හා vi පනත් වලින් ද
ii. විධිවිධානයන් - අංක iv, v හා vi පනත් වලින්ද සලසා ඇත.

1.4 සංවිධාන සැලැස්ම


ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
සභාපති
අධ්‍යක්ෂ ජනරාල්
ලේකම්/අධ්‍යක්ෂ(පාලන)
අධ්‍යක්ෂ (මුදල්)
අධ්‍යක්ෂ(ඉඩම්)
අධ්‍යක්ෂ(නීති)
නි. අධ්‍ය./ ස. අධ්‍ය. (පාලන)
නි. අධ්‍ය./ ස. අධ්‍ය. (මූල්‍ය)
නි. අධ්‍ය./ ස. අධ්‍ය. (ආදායම්)
නි. අධ්‍ය./ ස. අධ්‍ය. (ව්‍යාපෘති)
නි. අධ්‍ය./ ස. අධ්‍ය. (ඉ.උපරිම සීමා)
නි. අධ්‍ය./ ස. අධ්‍ය. (ඉඩම් පැවරීම්)
නි. අධ්‍ය./ ස. අධ්‍ය. (මැණුම්)
නි. අධ්‍ය./ ස. අධ්‍ය. (තක්.හා වන්දි)
නි. අධ්‍ය./ ස. අධ්‍ය. (කලාප)
නි. අධ්‍ය./ ස. අධ්‍ය. (නීති)
නි. අධ්‍ය./ ස. අධ්‍ය. (විමර්ශන)
නි. අධ්‍ය./ ස. අධ්‍ය. (අභ්‍යන්. විගණක)
පරිපාලන නිලධාරි
තොරතුරු තාක්ෂණ නිලධාරි
ගිණුම් නිලධාරි
සැලසුම් ශිල්පි
තක්සේරු පරීක්ෂක
කළමනාකරණ සහකාර
ප්‍රවාහන සහකාර
කළමනාකරණ සහකාර
රියදුරු/ කාර්යාල කාර්ය සහායක
කාර්යාල කාර්ය සහායක

1.5 අංශ සහ දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩල

1.5.1 ප්‍රධාන අංශයයන්

i. කළමනාකරණ සහ මානව සම්පත් සංවර්ධන අංශය
ii. ඉඩම් අංශය
iii. මුදල් අංශය
iv. නීති අංශය

1.5.2 දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩල

සභාව දිවයින පුරා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් පැතිරි පවතින දිස්ත්‍රික් කාර්යාල 20 කින් සමන්විත වේ. මෙම දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩල කාර්යාල විසින් පහත කටයුතු සිදු කරනු ලබයි.

- ❖ දිස්ත්‍රික් කාර්යාල පරිපාලනය කිරීම.
- ❖ අමාත්‍යාංශය හා ප්‍රධාන කාර්යාලයේ පැවැත්වෙන සාකච්ඡා හා සම්මන්ත්‍රණ වලට සහභාගී වීම.
- ❖ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙනුවෙන් දිස්ත්‍රික්කයේ පැවැත්වෙන ජංගම සේවා වලට සහභාගී වීම.
- ❖ කට්ටිකරුවන් තෝරා ගැනීමේ පරීක්ෂණ පැවැත්වීම.
- ❖ රජයේ අවශ්‍යතාවය සඳහා ආයතන වලට හා පුද්ගලික ආයතන වලට ඉඩම් ලබා දීම.
- ❖ දිස්ත්‍රික් ඉඩම් ලේඛණ සැකසීම යාවත්කාලීන කිරීම හා ඊට අදාල රාජකාරි කටයුතු.
- ❖ දිස්ත්‍රික්කයේ ඉඩම් ලේඛණය, බැහැර කළ ඉඩම් ලේඛණය හා අනවසර ලේඛණය යාවත්කාලීන කිරීම.
- ❖ මාසිකව භෞතික හා මූල්‍ය ප්‍රගති වාර්තා සකස් කර ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම.
- ❖ දිස්ත්‍රික්කයට අදාළ විගණන විමසීම් හා ලිපි සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යාලය සමඟ සාකච්ඡා කර ලබා දෙන උපදෙස් අනුව කටයුතු කිරීම.
- ❖ දිස්ත්‍රික්කයට අදාළ ඉඩම් නඩු සඳහා අධිකරණයේ පෙනී සිටීම.
- ❖ තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ලැබෙන ඉල්ලීම් සම්බන්ධයෙන් ඊට අදාළ තොරතුරු ප්‍රධාන කාර්යාලයේ තොරතුරු නිලධාරි වෙත නියමිත කාලයේ දී ඉදිරිපත් කිරීම.
- ❖ දිස්ත්‍රික් මට්ටමින් පැවැත්වෙන ඔප්පු ලබාදීමේ උත්සව සංවිධානය කිරීම.
- ❖ පවරා ගෙන ඇති නමුත් පනතින් බැහැර වන ඉඩම් ආපසු ලබා දීමට අදාල කටයුතු.
- ❖ රජයේ සංවර්ධන ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීම සම්බන්ධීකරණය හා පසු විපරම් කටයුතු.
- ❖ විධිමත් පරිදි අත්පත් කර නොගත් ඉඩම් අත්පත් කර ගැනීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු කිරීම.
- ❖ බෙදා දීමට සුදුසු ඉඩම් කොටස් මැණුම් කිරීම සඳහා පෙන්වා දී මිනුම්දෝරුවන්ට සහය වීම.

දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩල කාර්යාල පිහිටුවා ඇති දිස්ත්‍රික්ක සහ ලිපිනයන් පහත පරිදි වේ.

වගුව 1: දිස්ත්‍රික් කාර්යාල විස්තර

අනු අංකය	පළාත	දිස්ත්‍රික් කාර්යාල	ලිපිනය
1	බස්නාහිර පළාත	කොළඹ	සෙන්ටර් ෆාමසි ගොඩනැගිල්ල, පාදුක්ක
		කළුතර	අංක 184/A , පන්සල පාර, කළුතර උතුර
		ගම්පහ	කාර්යාල අංක 22, 6 වෙනි මහල, ලක්සය නෑ මන්දිරය, ගම්පහ
2	දකුණු පළාත	ගාල්ල	අංක 27, රිව්මන්ඩ් කන්ද පාර, කළුවැල්ල, ගාල්ල
		මාතර	අංක 17/ඒ, ධර්මරත්න පාර, උයන්වත්ත, මාතර
		තංගල්ල	උසාවිය පාර, තංගල්ල
3	ඌව පළාත	මොණරාගල	ජනසවි ගොඩනැගිල්ල, කච්චේරි හන්දිය, මොණරාගල
		බදුල්ල	අංක 195, කැප්පෙටිපොළ පාර, බදුල්ල
4	නැගෙනහිර පළාත	අම්පාර	කච්චේරිය, අම්පාර
		මඩකලපුව	කච්චේරිය, මඩකලපුව
5	උතුරු පළාත	යාපනය	කච්චේරිය, යාපනය
6	උතුරු මැද පළාත	අනුරාධපුර	අංක 388/17, වැව පාර, 1 වන පිවයර, නව නගරය, අනුරාධපුරය
7	සබරගමුව පළාත	රත්නපුර	ෆාම් ගාඩින් වත්ත, නව නගරය, රත්නපුර
		ඇඹිලිපිටිය	12 බී, තොග ගබඩාව පාර, නව නගරය,ඇඹිලිපිටිය
		කෑගල්ල	කච්චේරිය, කෑගල්ල
8	වයඹ පළාත	පුත්තලම	පම්බල, කාකපල්ලිය, මාදම්පේ
		කුරුණෑගල	අංක 16, උතුරු වැව පාර, කුරුණෑගල
9	මධ්‍යම පළාත	නුවරඑළිය	I.R.D.Pගොඩනැගිල්ල,උඩුපුස්සැල්ලාව පාර, නුවරඑළිය
		මහනුවර	සිව්වන මහල,නව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර
		මාතලේ	කච්චේරිය, මාතලේ

2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 කළමනාකරණ සහ මානව සම්පත් සංවර්ධන අංශය

2.1.1 ආයතනික කටයුතු

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2023 වර්ෂය හා සසඳමින් මෙම වර්ෂයේ ආයතනික කටයුතු කාර්ය සාධනය 2 වගුව මඟින් ඉදිරිපත් කොට ඇත.

වගුව 2: 2023 වර්ෂයේ ආයතනික කටයුතු පිළිබඳ තොරතුරු

අනු අංකය	විස්තර	පෙර වර්ෂය (2022)			ප්‍රවර්තන වර්ෂය (2023)		
		ඉල්ලිම් සංඛ්‍යාව	අනුමත කල සංඛ්‍යාව	ඉතිරි සංඛ්‍යාව	ඉල්ලිම් සංඛ්‍යාව	අනුමත කල සංඛ්‍යාව	ඉතිරි සංඛ්‍යාව
1.	සේවයට බඳවා ගැනීම්	-	-	-	-	-	-
2.	විභාග පැවැත්වීම්	-	-	-	-	-	-
3.	සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම්	-	-	-	-	02	-
4.	සේවය ස්ථීර කිරීම්	-	-	-	-	-	-
5.	උසස් කිරීම්	-	-	-	-	01 *	-
6.	වැටුප් වර්ධක ගෙවීම්	-	304	-	-	290	-
7.	සේවය දිර්ඝ කිරීම්	-	75	-	70	70	-
8.	බඳවා ගැනීමේ පරිපාටි සැකසීම	01	-	01	01	-	01
9.	සේවයෙන් විශ්‍රාම ගැනීම් හා හැරයෑම්	-	8	-	-	23	-
10.	වැඩ තහනම් කිරීම්	-	01	-	-	01	-
11.	නැවත සේවයේ පිහිටුවීම්	-	-	-	-	01	-
12.	විනය පරීක්ෂණ	-	02	-	-	03	-
13.	විදේශ නිවාඩු අනුමත කිරීම්	-	07	-	-	04	-
14.	පුහුණු කිරීම්	-	04	-	18	08	10
15.	අමාත්‍ය මණ්ඩල සංදේශ	-	03	-	-	03	-
16.	ඇප ආරම්භ කිරීම්	-	-	-	-	-	-
17.	ඇප නිදහස් කිරීම්	-	-	-	04	-	-
18.	ණය අනුමත කිරීම් I. දේපල II. වාහන III. වෙනත්	- - 129	- - 128	- - -	- - 695	- - 695	- - -

* බේරුම්කරණ නඩු තීන්දුවක් අනුව උසස් වීම් ලබා දෙන ලදී.

2.2 ඉඩම් අංශය

2.2.1 ඉඩම් පැවරීම් අංශය

3 වගුව මඟින් 2023.01.01 සිට 2023.12.31 දිනට ඉඩම් පැවරීම් අංශයේ කාර්ය සාධනය පෙන්නුම් කරනු ලබයි.

වගුව 3 : 2023 වර්ෂයේ ඉඩම් පැවරීම් අංශයේ කාර්ය සාධනය

අනු අංකය	ව්‍යාපෘති	වාර්ෂික ඉලක්කය	නිම කල සංඛ්‍යාව
1.	නිවාස අරමුණු හා ජීවනෝපාය සලසා ගැනීමේ අවශ්‍යතාවය මත ඉඩම් විකිණීම්. ඔප්පු ප්‍රදානය හා ශාසනාභිවන්දා ඔප්පු ලබාදීම. ඉඩම් ගැටලු විසඳීමේ ජංගම සේවාව	15000 21	935 06

2.2.2 ව්‍යාපෘති අංශය

4 වගුව මඟින් 2023.01.01 සිට 2023.12.31 දිනට ව්‍යාපෘති අංශයේ කාර්ය සාධනය පෙන්නුම් කරනු ලබයි.

වගුව 4 : 2023 වර්ෂයේ ව්‍යාපෘති අංශයේ කාර්ය සාධනය

අනු අංකය	ව්‍යාපෘති	වාර්ෂික ඉලක්කය	නිම කල සංඛ්‍යාව
1.	ආහාර සුරක්ෂිතතාව වර්ධනය කිරීම සඳහා කෙටිකාලීන බෝග වගාව වෙනුවෙන් ඉඩම් ලබාදීම.	50	28
2.	ඛණිජ සම්පත් ආශ්‍රිත ආර්ථික ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීම.	02	01
3.	කෘෂිකාර්මික කටයුතු සඳහා ඉඩම් ලබාදීම. - භුක්තිය භාරදීම් - බදු ඔප්පු ලබාදීම්	} 50	38 14
4.	කර්මාන්ත අමාත්‍යාංශ ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීම.	10	10
5.	කෘෂිකාර්මික නොවන කටයුතු සඳහා ඉඩම් ලබාදීම්	70	11

❖ අංක අමප/22/1769/640/012 හා 2022.11.14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් නිකුත් කරන ලද 2023.05.25 දිනැති ලිපිය මඟින් සියළුම බැහැර කිරීම් නවතා ඇත.

2.2.3 ඉඩම් උපරිම සීමා අංශය

5 වගුව මඟින් 2023.01.01 සිට 2023.12.31 දිනට ඉඩම් උපරිම සීමා අංශයේ කාර්ය සාධනය පෙන්නුම් කරනු ලබයි.

වගුව 5 : 2023 වර්ෂයේ ඉඩම් උපරිම සීමා අංශයේ කාර්ය සාධනය

අනු අංකය	විස්තරය	ඉලක්කය	නිම වූ සංඛ්‍යාව
1.	19 වන වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත නිශ්චය සඳහා ඉඩම් ලබාදීම.	07	04
2.	14 වන වගන්තිය යටතේ ඉඩම් ලබාදීම.	01	01
3.	22 වන වගන්තිය යටතේ - පවුල තුල පැවරීම් ලෙස ඉඩම් ලබාදීම. - බාලවයස්කාර යටතේ ඉඩම් ලබාදීම.	06	09 01
4.	ප්‍රකාශක නොවන අයගේ ඉඩම් නිදහස් කිරීම.	02	06

2.2.4 රාජ්‍ය ආයතන අංශය

6 වගුව මඟින් 2023.01.01 සිට 2023.12.31 දිනට රාජ්‍ය ආයතන අංශයේ කාර්ය සාධනය පෙන්නුම් කරනු ලබයි.

වගුව 6 : 2023 වර්ෂයේ රාජ්‍ය ආයතන අංශයේ කාර්ය සාධනය

අනු අංකය	විස්තරය	ඉලක්කය (අක්කර)	නිම වූ සංඛ්‍යාව (අක්කර)
1.	පළාත් පාලන ආයතන වලට විකිණීමෙන් ලබාදීම.	08	40
2.	රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා විකිණීමෙන් ලබාදීම.	34	676

❖ ඉහත අක්කර ප්‍රමාණය වාර්තා කැඳවීම්, මැනුම් නියෝග, කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම්, තක්සේරු කැඳවීම්, තක්සේරුව දැනුම් දීම, ඇමතිතුමාගේ අනුමැතිය හා ඔප්පු අංශයට යොමු කිරීමට අදාළ අක්කර ප්‍රමාණය වේ.

2.3 නීති අංශය

7 වගුව මගින් 2023.01.01 සිට 2023.12.31 දිනට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් මෙහෙයවනු ලැබූ නඩු කටයුතු පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරනු ලබයි.

වගුව 7 : 2023 වර්ෂයේ නඩු කටයුතු පිළිබඳ සංඛ්‍යා දත්ත

අනු අංකය	විස්තරය	2022.12.31 දිනට පවතින නඩු	2023 වර්ෂය තුල නිම වූ සමතයට පත් වූ නඩු	2023 වර්ෂය තුල පවරන ලද නඩු සංඛ්‍යාව		2023.12.31 දිනට පවතින නඩු
				ඉ.ප්‍ර.කොා.ස විසින් පවරන ලද	ඉ.ප්‍ර.කොා.ස. විරුද්ධව	
1.	ශ්‍රේෂ්ඨාධිකරණය	43	04	08	10	57
2.	අභියාචනාධිකරණය	73	10	00	18	81
3.	මහාධිකරණය	36	03	00	12	45
4.	දිසා අධිකරණය	695	23	00	93	767
5.	මහේස්ත්‍රාත් අධිකරණය	108	02	14	00	120
6.	කම්කරු විනිශ්චය සභාව	02	01	00	00	01
7.	මානව හිමිකම් කොමිෂන් සභාව	13	06	00	15	22
8.	සිවිල් අභියාචනා මහාධිකරණය	29	16	03	14	30
	එකතුව	**999**	**63**	**25**	**162**	**1123**

2.4 අභ්‍යන්තර විගණන අංශය

2.4.1 විගණනය සඳහා බලය

1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත හා 1971 අංක 38 දරන මුදල් පනත අනුව සැකසුන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා මුදල් සංග්‍රහයේ 11 වන කොටසේ 02 වන වගන්තියේ අනු වගන්ති 01 – 03 අනුව විගණනය සඳහා බලය ලැබී ඇත.

2.4.2 වසර තුළ ඉටු කරන ලද රාජකාරි

වගුව 8 : 2023 වර්ෂය තුළ විගණන අංශය විසින් සිදුකල රාජකාරි		
අනු අංකය	විස්තරය	
1.	කාර්යාල විගණනය	06
2.	විගණන සැලැස්මට අනුව අභ්‍යන්තර විගණන විමසුම් නිකුත් කිරීම	35
4.	ආයතනික විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්	04
5.	පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීට අවශ්‍ය වාර්තා සැකසීම හා තොරතුරු ලබාදීම	
6.	2023 අමාත්‍යාංශයීය විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම සඳහා අවශ්‍ය තොරතුරු ලබා දීමට අදාළ කටයුතු සිදු කිරීම.	
7.	ප්‍රසාද දීමනා සම්බන්ධ වවුචර්පත්, වැටුප් රහිත නිවාඩු සමඟ ගැලපීම් කර විගණනය කිරීම.	
8.	සියළු නව පත්වීම් වලට අදාළ වැටුප් පරීක්ෂා කිරීම.	

.....

නීතිඥ පණ්ඩුක කීර්තීනන්ද
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
නො. 475, කඩුවෙල පාර,
බත්තරමුල්ල.

3. 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති හඳුන්වාදීම

3.1.1 ආයතනික තොරතුරු

1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව ස්ථාපිත කරන ලදී.

එහි අරමුණ වූයේ ඕනෑම පුද්ගලයකු සතු කෘෂිකාර්මික ඉඩම්වල උපරිම සීමාවට වඩා වැඩි ප්‍රමාණය පවරා ගැනීම සහ එම ඉඩම්වල ඵලදායිතාව සහ එම ඉඩමෙන් උත්පාදනය වන රැකියාවැඩි කිරීමට හේතු වන අයුරින් ප්‍රයෝජනයට ගැනීමයි. පසුකාලීනව, ඉහත පනත අවස්ථානුකූලව සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන්ට අනුව 1975 අංක 39, 1981 අංක 14, 1981 අංක 39, 1986 අංක14, සහ 1986 අංක 18 ලෙසින් අවස්ථා කිහිපයකදී සංශෝධනය කර ඇත.

අංක PED/3/2015 සහ 2015 ජූනි 17 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය පරිදි, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව රජයට අයත් ව්‍යවසායන් හී "ඇ" උප-වර්ගය යටතේ වර්ගීකරණය කර ඇත.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ මූලික කටයුතු හා මෙහෙයුම්වල ස්වභාවය

කොමිෂන් සභාවේ මූලික කටයුතු වන්නේ ඉඩම් හිමියන්ගේ ව්‍යවස්ථාපිත බැඳීම් නිදහස් කිරීම සහ ඔවුන්ට වන්දි මුදල් ගෙවීම, ඵලදායී ආයෝජනවල යොදවන භාවිතා කිරීම, සහ කොමිෂන් සභාවේ ආදායම් එකතු කිරීම, ඉඩම් ආරක්ෂා කිරීම සහ කාර්ය මණ්ඩලය පුහුණුව සහ ශුභසාධනය වේ

2023 වසර අවසානයේදී කොමිෂන් සභාවේ සේවක සංඛ්‍යාව 496 ක් විය.

නිකුත් කිරීම සඳහා බලය ලබාදුන් දිනය

2023 වසර සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන 2024 පෙබරවාරි 26 දින කොමිෂන් සභාව විසින් සහතික කරන ලදී.

අඛණ්ඩතා පැවැත්ම පදනම

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩතා පැවැත්ම පදනම මත පිළියෙල කරනු ලැබී ඇත.

මූල්‍ය කාලසීමාව

කොමිෂන් සභාවේ මූල්ය කාලසීමාව 2023 ජනවාරි 01 සිට 2023 දෙසැම්බර් 31 දක්වා මාස දොළහක කාලසීමාවකට අයත් වේ.

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ පදනම

අනුකූලතා ප්‍රකාශය

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා චරලත් ගණකාධිකාරී ආයතනයේ රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති කමිටුව විසින් නිකුත් කළ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති (SLPSAS) 1 සිට 20 ට අනුකූලව පිළියෙල කරනු ලැබ ඇත. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ SLPSAS 1ට අනුව මූල්‍ය ප්‍රකාශවලට සටහන් වලින් සමන්විත වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදා ගනු ලබන මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත. මෙම ප්‍රතිපත්ති වෙනත් ආකාරයකින් සඳහන් කර ඇත්නම් මිස මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත්කරන සියලුම කාලපරිච්ඡේදයන් සඳහා අනුරූපව යොදා ගෙන ඇත.

මැනීමේ පදනම

මූල්‍ය ප්‍රකාශ අදාළ සටහන් යටතේ සාධාරණ අගය සම්බන්ධයෙන් සුදුසු අනාවරණ සිදුකරන අවස්ථාවන් හැර උපචිත පදනමක් මත සහ ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කරනු ලැබ ඇත.

තුලනාත්මක තොරතුරු

ප්‍රමාණාත්මක, කථන සහ විස්තරාත්මක තොරතුරු ඇතුළුව තුලනාත්මක තොරතුරු තුලනාත්මකභාවය ඉහළ නැංවීම සඳහා වර්තමාන කාලසීමාව සහ ආසන්න අතීත කාලසීමාවන්හි මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අවබෝධය වැඩි කිරීම පිණිස පසුගිය කාලසීමාවන් සම්බන්ධයෙන් අනාවරණය කරන අතර, අවශ්‍ය අවස්ථාවලදී, වර්තමාන වසරේ ඉදිරිපත් කිරීම තහවුරු කිරීමට තුලනාත්මක සංඛ්‍යා නැවත සකස් කර ඇත.

ප්‍රමාණතාව සහ සමාහරණය

එක සමාන අයිතමවල එක් එක් වැදගත් පන්ති මූල්‍ය ප්‍රකාශවල වෙන වෙනම ඉදිරිපත් කෙරේ. අසමාන ස්වභාවයේ හෝ කාර්යයේ අයිතම ඒවා වැදගත් නොවේනම් මිස වෙන වෙනම ඉදිරිපත් කෙරේ.

ක්‍රියාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කරන අතර එය කොමිෂන් සභාව ක්‍රියාත්මක මූලික ආර්ථික පරිසරය තුළ කොමිෂන් සභාවේ ක්‍රියාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල වේ.

3.1.2 සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

දේපල, පිරියත හා උපකරණ

කොමිෂන් සභාවේ දේපල, පිරියත හා උපකරණ SLPSAS-7 ට අනුව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇත. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව ශ්‍රී ලංකා තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2019 ජනවාරි 01 දිනට 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට හිමි වූ ඉඩම් හැර සියලුම ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගනණය කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශනවල දේපල, පිරියත හා උපකරණවල වටිනාකම 2019 මිලදී ගැනීම්වලට පෙර ප්‍රත්‍යාගණන පදනම මත සඳහන් කරන අතර, 2019 වසර තුළ සහ 2019 වසරෙන් පසු මිලදීගත් වත්කම් මිලදී ගැනීමේ පිරිවැය පදනම මත සඳහන් කර ඇත. ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන ක්‍රියාවලියේ අතිරික්තය හෝ හිඟය මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ප්‍රත්‍යාගණන සංචිතය ලෙස දක්වා ඇත. ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාරයේ පාලක ජනරාල් කාර්යාලය විසින් දෙන ලද උපදෙස් සහ මඟපෙන්වීමට අනුකූලව අංක 03 උපලේඛණයේ වර්ගීකරණ හතරට දේපල, පිරියත හා උපකරණ වර්ගීකරණය කර ඇත.

අස්පෘශ්‍ය වත්කම් අනාවරණය කිරීම

SLPSAS -20 අනුව, කොමිෂන් සභාවට අයත් සියලුම අස්පෘශ්‍ය වත්කම් අස්පෘශ්‍ය වත්කම් යටතේ අනාවරණය කර ඇති අතර, එම අස්පෘශ්‍ය වත්කම් පවත්නා අස්පෘශ්‍ය වත්කම් ප්‍රතිපත්ති සමඟ සරල මාර්ගික ක්‍රමය මත ක්‍රමක්ෂය කරනු ලැබේ. කොමිෂන් සභාවේ අස්පෘශ්‍ය වත්කම්වල වටිනාකම අංක 03 උපලේඛණයේ පසු කොටසක අනාවරණය කෙරේ.

හඳුනාගැනීමේ සහ අගය කිරීමේ පදනම

වත්කම හා බැඳුණු අනාගත ආර්ථික ප්‍රතිලාභකොමිෂන් සභාව වෙත ගලා එන සහ වත්කමේ වටිනාකම පහසුවෙන් මැනිය හැකි අවස්ථාවේදී දේපල, පිරියත හා උපකරණ හඳුනා ගනී. අළුත්වැඩියා සහ නඩත්තු වියදම් ඒවා දරා ඇති පරිදි විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනී. යම් සිදුවීම් හෝ වෙනස්වීම් හේතුවෙන් ධාරණ අගය අයකරගත නොහැකි බවට හැඟවීමක් ඇති අවස්ථාවලදී දේපල, පිරියත හා උපකරණවල ධාරණ අගය හානිකරණය සඳහා සමාලෝචනය කරනු ලබයි.

ක්ෂයකිරීම

කොමිෂන් සභාවේ දේපල, පිරියත හා උපකරණ ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය 2018 වසරේ සිට ඉදිරියට සහ කොමිෂන් සභාවේ දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණන ක්‍රියාවලියෙන් පසුව හීනවන ශේෂ ක්‍රමයේ සිට සරල මාර්ගික ක්ෂය කිරීමේ ක්‍රමය දක්වා වෙනස් කර ඇත. නව ක්ෂය කිරීමේ ප්‍රතිපත්තියට අනුව, අත්කරගත් වත්කම් සහ ප්‍රත්‍යාගණන වත්කම් මිලදීගත් දිනයට හෝ වත්කමේ ප්‍රත්‍යාගණන මුදලට මුළු අත්කරගත් පිරිවැයෙන් රුපියල දක්වා ක්ෂය කරනු ලබයි. වත්කමේ ඉතිරි වටිනාකම වත්කමේ ඵලදායී ජීවකාලය භාවිතා කරමින් එක සමානව වෙන් කරනු ලබයි.

කොමිෂන් සභාවේ දේපල, පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම්වල තක්සේරුගත ක්ෂය කිරීමේ සහ ක්‍රමක්ෂය අනුපාත පාලක ජනරාල් කාර්යාලය විසින් නිකුත් කළ අංක 1/2017 සහ 2017 ජූනි 28 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛයට අනුකූලව වර්ගීකරණය කර පහත විස්තර කෙරේ.

වත්කම් වර්ගය	ක්ෂය කිරීමේ/ ක්‍රමක්ෂය කිරීමේ අනුපාතය	වත්කම් වර්ගය	ක්ෂය කිරීමේ/ ක්‍රමක්ෂය කිරීමේ අනුපාතය
ගොඩනැගිලි		වාහන	
කාර්යාල ගොඩනැගිල්ල	5%	මෝටර් රථ	10%
සංචාරක බංගලා	5%	බයිසිකල් හා මෝටර් බයිසිකල්	20%
ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ		**පිරියත හා යන්ත්‍ර**	
ගෘහභාණ්ඩ	10%	මාධ්‍ය උපකරණ	20%
පරිගණක සහ තොරතුරු තාක්ෂණ උපකරණ	20%	ඉදිකිරීම් උපකරණ	20%
පරිගණක මෘදුකාංග	20%	ශීතකිරීමේ යන්ත්‍ර	20%
සන්නිවේදන උපකරණ	20%	විදුලි උපකරණ	20%
කාර්යාල උපකරණ	20%	ඉඩම් පිරිසිදු කිරීමේ උපකරණ	20%
ගෘහස්ථ උපකරණ	20%		

හඳුනා නොගැනීම

දේපල, පිරියත හා උපකරණවල යම් අයිතමයක් බැහැර කිරීම මත හෝ එහි භාවිතයෙන් හෝ බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා කළ නොහැකි අවස්ථාවලදී හඳුනා නොගනී. වත්කම හඳුනා නොගැනීමෙන් ඇතිවන යම් ලාභයක් හෝ අලාභයක් ශුද්ධ බැහැර කිරීමෙන් ලත් මුදල සහ ධාරණ අගය අතර

වෙනස ලෙස ගණනය කරන අතර, වත්කම හඳුනා නොගන්නා වසර තුළ විස්තිර්ණ ආදායම් ප්‍රකාශය තුළ ඇතුළත් කෙරේ.

ආයෝජන වත්කම් - කොමිෂන් සභාවට හිමි වූ ඉඩම් හඳුනාගැනීමේ සහ ප්‍රත්‍යාගණනය කිරීමේ ක්‍රියාවලිය

1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ කොමිෂන් සභාවට හිමි වූ ඉඩම් SLPSAS13 යටතේ ආයෝජන දේපල ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි දක්වා ඇත. මෙයට හේතුව හිමි වූ ඉඩම් දිගුකාලීන බදු පදනම තුළින් කොමිෂන් සභාවේ ආදායම් උත්පාදන ක්‍රියාවලිය සඳහා භාවිතා කිරීමයි.

කොමිෂන් සභාවට හිමි වූ ඉඩම් හඳුනාගැනීමේ සහ ප්‍රත්‍යාගණනය කිරීමේ ක්‍රියාවලිය තවමත් සිදුවෙමින් පවතින කාර්යයකි. කොමිෂන් සභාවට හිමි වූ දැනටමත් හඳුනාගෙන ඇති ඉඩම් සඳහා 2023 වසර ආරම්භයේදී ඒහි ප්‍රත්‍යාගණන ක්‍රියාවලිය ආරම්භ කර ඇත. මෙම කාර්යයන් දෙන සම්පූර්ණ කිරීම සඳහා,හඳුනාගැනීමේ සහ ප්‍රත්‍යාගණනය කිරීමේ ක්‍රියාවලියේ සංකීර්ණතාව හේතුවෙන් වසර ගණනාවක් ගතවිය හැකිය. 2023 වසර අවසානය දක්වා, ශ්‍රී ලංකා තක්සේරු දෙපාර්තමේන්තුව විසින් දෙන ලද ප්‍රත්‍යාගණන ඉඩම් සංඛ්‍යා අංක 04 උපලේඛණයේ අනාවරණය කෙරේ.

භාණ්ඩ තොග

කොමිෂන් සභාවේ භාණ්ඩ තොග SLPSAS– 09 ට අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි වාර්තා කරන අතර පෙර පිවිසි පෙර පිටවුම් ක්‍රමයට (FIFO– නිකුත් කර අගය කෙරේ. වසර අවසානයේදී, භාණ්ඩ තොග වල වර්තමාන මිලදී ගැනිමේ පිරිවැය/ මුදලට භාණ්ඩ තොග සඳහන් කෙරේ. කොමිෂන් සභාවේ භාණ්ඩ තොගවලට විවිධ වර්ගයේ යෙදුම්, ලිපිද්‍රව්‍ය සහ පාරිභෝගික භාණ්ඩ ඇතුළත් වේ.

මූල්‍ය වත්කම් - මූලික හඳුනා ගැනීම සහ අගය කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 හි විෂය පථය තුළ මූල්‍ය වත්කම් ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම්, ණය සහ ලැබීම්, කල්පිරෙන තෙක් රඳවාගන්නා ආයෝජන ලෙස වර්ගීකරණය කෙරේ. කොමිෂන් සභාව ණය සහ ලැබීම් සහ තැන්පතු ඒවා උත්පාදනය වන දිනයට හඳුනා ගනී.

කොමිෂන් සභාවේ මූල්‍ය වත්කම්වලට ලැබීම්, සේවකයින්ට ණය සහ අත්තිකාරම්, කල්පිරෙන තෙක් රඳවාගන්නා මුල්‍ය වත්කම්, සහ මුදල් හා මුදලට සමාන දෑ ඇතුළත්ය. ණය සහ ලැබීම් ඒවා උත්පාදනය වන දිනයට හඳුනා ගනී. ණය සහ ලැබීම් ඒවායේ පිරිවැයට සඳහන් කෙරේ. ණය සහ ලැබීම් වෙළෙඳ ලැබීම්, සේවක ණය සහ අත්තිකාරම්, තැන්පතු සහ වෙනත් ලැබීම්වලින් සමන්විත වේ.

කොමිෂන් සභාවට මහා පරිමාණයේ දිගුකාලීන ණය ගැතියන්ගෙන් ලැබිය යුතු දෑ

මූල්‍ය තත්ත්ව සටහන් අංක 05 යටතේ දක්වා ඇති පරිදි, දිගුකාලීන ණයගැතියන් රු. 2,135,278,456.34 ක් ලෙස පෙන්නුම් කරන අතර, ඒවායින්, රු. 2,068,913,696.98ක් 1986වසර හා ඉන් ඉදිරියට ජනතා වතු සංවර්ධන මණ්ඩලය (JEDB) සහ රාජ්‍ය වැවිලි සංස්ථාව (SPC) වෙතින් ලැබියයුතු මහ පරිමාණයේ දිගු කාලීන ණයගැතියන් සඳහා වේ. ඒ සඳහා 1995 වසර හා ඉන් ඉදිරියට මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා ඇති ප්‍රමාණ සම්බන්ධයෙන් වෙනසක් නොමැත.

විශේෂයෙන්, කොමිෂන් සභාවට මහා පරිමාණයේ දිගුකාලීන ණය ගැතියන්ගෙන් ලැබිය යුතු දෑ වසර විස්සට වඩා වැඩි රජයට අදාළ සංවිධාන/ආයතන හයකින් සමන්විත වේ. මෙම මහා පරිමාණයේ දිගුකාලීන ණය ගැතියන්ගෙන් ලැබියයුතු දෑ පහත දක්වා ඇත.

අනු අංකය	සංවිධානය/ආයතනයේ නම	ලැබීම ආරම්භ වන වසර	ලැබිය යුතු ප්‍රමාණය (රු.)
01	ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව	1986/89/95	2,068,913,696.98
02	ශ්‍රී ලංකා භදබිම අධිකාරිය	1989	54,911,756.38
03	මැතිවරණ අංශයේ සමූපකාර සමිති	1995	5,073,663.00
04	ඉඩම් අමාත්‍යාංශය	2003	3,252,654.00
05	විවිධ සේවා සමුපාකාර සමිති	1980	3,126,685.98
මුළු වටිනාකම			**2,135,278,456.34**

අදාළ සංවිධාන/ආයතන වෙතින් ඉහත ලැබියයුතු මුදල් අයකර ගැනීමට කොමිෂන් සභාව උත්සාහයන් කිහිපයක් සිදුකර තිබුනද, එවැනි උත්සාහයන් සාර්ථක නොවීය. විශේෂයෙන්, ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල කොමිෂන් සභාවට ගෙවියයුතු කිසිදු වගකීමක් පිළිබිඹු නොකිරීම හේතුවෙන් අයකර ගැනීමේ උත්සාහයන් අසාර්ථක විය. එබැවින්, රජයේ ආයතන තුළ ගෙවීම පිළිබඳ සාධකය සලකා බලමින් මෙම කාරණය විසඳීමට සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්ගේ ප්‍රධානත්වය යටතේ අදාළ පාර්ශවකරුවන් සමඟ විශේෂයෙන් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්ගේ සහ මහා භාණ්ඩාගාරයේ නියෝජිතයින්ගේ සහභාගිත්වයෙන් රැස්වීමක් පවත්වන ලදී.

මෙම සාකච්ඡාවේ ප්‍රතිඵලයක් ලෙස සහ අදාළ පාර්ශව සහ බලධාරීන් අතර ලිපි හුවමාරු සිදු වූ අතර, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව (PED) කොමිෂන් සභාව වෙත 2023 මාර්තු 07 දිනැති ලිපියක් නිකුත් කරමින් රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ රජයට අයත් ව්‍යවසාය සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 6.9 වගන්තියට අනුව කටයුතු කරන මෙන් උපදෙස් ලබා දෙන ලදී. එම ක්‍රියාපටිපාටිය 2023 ජූලි 17 දින නිකුත් කළ අමාත්‍ය මණ්ඩල තීරණයේ සාමාජිකයින් විසින් ද තහවුරු කොට ඇත. එම මගපෙන්වීම් දෙකට අනුව, කොමිෂන් සභාව විසින් රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ රජයට අයත් ව්‍යවසාය සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 6.9 වගන්තියට අනුව පවත්නා ගැටළුව නිරාකරණය කර ගැනීමට නිර්දේශ ලබා ගැනීම සඳහා සාමාජිකයින් පහකින් සමන්විත කමිටුවක් පත් කර ඇත. එය අදාළ ලැබියයුතු සංවිධාන සහ ආයතන එම කාර්ය පවරන ලද අමාත්‍යාංශ ඉහළ මට්ටමේ නිලධාරීන්ගෙන් සමන්විත විය. මෙම පත්කළ කමිටු සාමාජිකයින් 2023 අගෝස්තු 29 සහ නොවැම්බර් 07 දින සාකච්ඡාකර අදාළ කරුණු සෙවීම සඳහා දෙවරක් රැස් විය. ඉහත සඳහන් කමිටු සාමාජිකයින්ගේ සාකච්ඡාව සහ අදාළ සාක්ෂි සෙවීම කොමිෂන් සභාව වෙත නිර්දේශ ලබා දෙන තුරු ක්‍රියාත්මකව පවති.

කල්පිරෙන තෙක් රඳවාගන්නා මූල්‍ය වත්කම් (HTM)

වන්දි ගෙවීම සඳහා සංචිතය සහ කාලීන තැන්පතුවලින් ලද පොළිය, භාණ්ඩාගාර බිල්පත් සහ කෙටි කාලයක් සඳහා රජයේ බැංකුවල ආයෝජනය කළ REPO කල්පිරෙන තෙක් රඳවාගන්නා මූල්‍ය වත්කම් (HTM– ලෙස වර්ගීකරණය කරන ලදී.

මුදල් හා මුදලට සමාන දෑ

කොමිෂන් සභාවේ අතැති මුදල් ජංගම ගිණුම් තුනකින් සමන්විත වන අතර, එම ජංගම ගිණුම් අරමුදල් කළමනාකරණ ගිණුම් තුනකින් සහ ඉතුරුම් ගිණුම් දෙකක් හා සම්බන්ධ වන අතර, කොමිෂන් සභාවේ මුදල් කළමනාකරණයේ අත්‍යවශ්‍ය කොටසක් වන බැංකු ශේෂ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණ සඳහා මුදල් හා මුදලට

සමාන දෑ සංරචකයක් ලෙස ඇතුළත් කරන ලදී. මුදල් හා මුදලට සමාන දෑ අතැති මුදල්, බැංකුවේ මුදල් සහ බැංකු තැන්පතුවලින් සමන්විත වේ.

දිගු කාලීන ණය ලැබීම් කපා හැරීම

රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 01/2020 හි 2.2.1 වගන්තිය සහ මුදල් රෙගුලාසි අංක 105 ට අනුව, 2021 නොවැම්බර් 08 දින පැවති 762 වැනි කොමිෂන් සභා සැසියේදී කොමිෂන් සභා පත්‍රිකා අංක 11593 සඳහා දෙන ලද කොමිෂන් සභා තීරණය පරිදි, කොමිෂන් සභාව වෙත ලැබිය යුතු රු. 500,000 ට අඩු දිගුකාලීන ණය කපා දැමීම සඳහා කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දී ඇත.

ලැබිය යුතු මුළු ආදායම

කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යන මුළු බදුකරුවන්ගේ ලිපිගොනුවල ලිඛිත ලියවිලි ලබාගැනීමේ හැකියාව මත සහ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය (GSMB) විසින් දෙන ලද කාර්තුමය මුළු එකතුකළ ප්‍රමාණය මත පදනම් වී 2023 වසර සඳහා ලැබියයුතු මුළු ආදායම කොමිෂන් සභාව විසින් ඇස්තමේන්තු කරන ලදී. පුපුරණ ද්‍රව්‍ය පාලක විසින් නිකුත් කළ වෙඩි බෙහෙත් මත පදනම් වී කොමිෂන් සභාවට අයත් මුළු ඉඩම්වලින් එක් එක් මුළු බලපත්‍රහිමියන් විසින් ගනු ලබන මුළු කියුබි ප්‍රමාණය මත භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ මුළු ආදායම් එකතු කිරීම පදනම් වේ.

වගකීම් සහ වෙන් කිරීම්

ඇස්තමේන්තු කරන කාලසීමාවෙන් පසු මාස දොළහ තුළ පියවිය යුතු හෝ ඇස්තමේන්තු කරන කාලසීමාවෙන් පසු අවම වශයෙන් මාස දොළහ සඳහා වගකීම නිරවුල් කිරීම කල්දැමීමට ගිවිසුම්ගතවී නොමැති අයිතියක් නොමැති මූලික වශයෙන් එදිනෙදා මෙහෙයුම් අරමුණ සඳහා තබාගන්නා වගකීමක් සාමාන්‍ය මෙහෙයුම් රටාව තුළ පියවීමට අපේක්ෂා කරන විට, එම වගකීම ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කෙරේ. කොමිෂන් සභාව අනෙකුත් සියලුම වගකීම් ජංගම නොවන වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත.

කොමිෂන් සභාවේ සංස්ථාපිත ආදායම් බදු (CIT) වගකීම්

ශ්‍රී ලංකා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRDSL) විසින් 2018 වසරේ සිට ක්‍රියාත්මකව කොමිෂන් සභාව විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත සංස්ථාපිත ආදායම් බදු (CIT) ගෙවීමට බැඳී සිටින බව දන්වමින් 2023 ඔක්තෝබර් 17 දින කොමිෂන් සභාව වෙත නිවේදනයක් නිකුත් කර ඇත. එයට හේතුව, කොමිෂන් සභාව 2017 ජූනි 14 දින එකතුකළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි කර තිබීම වන අතර, එකතුකළ අගය මත බදු එකතු කිරීම 2017 ජූනි 01 දින සිට නිල වශයෙන් ආරම්භ කර ඇත. අනෙක් අතට, කොමිෂන් සභාවේ නම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ සංස්ථාපිත ආදායම් බදු සහන සංවිධාන/ආයතන ලැයිස්තුවේ නොමැත. ඉන් පසුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු වර්ෂය සලකා බැලීම වෙනුවට කොමිෂන් සභාවේ මූල්‍ය වර්ෂය (ජනවාරි 01දින සිට දෙසැම්බර් 31 දක්වා) මත පදනම් වී කොමිෂන් සභාවේ නියමිත සංස්ථාපිත ආදායම් බදු ගෙවීමට අවසරය ඉල්ලා සිටීමින් කොමිෂන් සභාව විසින් 2023 නොවැම්බර් 24සහ 2024 පෙබරවාරි 08 දින දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙතින් නිල ඉල්ලීමක් සිදුකර ඇත. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ තීරණය තවම ලැබී නොමැති අතර, කොමිෂන් සභාව තීරණය සහසංස්ථාපිත ආදායම් බදු කෙටුම්පත් ගණනය කිරීම මත පදනම් වී අවශ්‍යතාව පරිදි වර්තමාන වසර සහ පසුගිය වසර පහ සඳහා සංස්ථාපිත ආදායම් බදු ගෙවීම් වෙන් කිරීම සිදු කිරීමට අපේක්ෂාවෙන් සිටී.

සිමාසහිත එසුෆාලි (Esufalie) සමාගම වෙත ගෙවියයුතු අධිකරණ වන්දි මුදල

සිමාසහිත එසුෆාලි (Esufalie) සමාගම විසින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතේ වගන්ති සහ එකී පනත විසින් සලසා දෙන විධි විධාන උල්ලංඝනය කරමින් කොමිෂන් සභාව විසින් සිමාසහිත එසුෆිලි (Esufalie) සමාගමේ තේ වගාකරන ලද ඉඩම් නීතිවිරෝධීව අත්කර ගෙන ඇති බව පවසමින් ඉඩම්

ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට එරෙහිව උසාවි නඩු හයක් ගොනු කරන ලදී. උසාවි තීරණය 2001 පෙබරවාරි 23 දින නිකුත් කළ අතර, එම නඩු හය සඳහා එම දිනයේ සිට 2023 දෙසැම්බර් 31දක්වා ගෙවිය යුතු මුළු වන්දි මුදල රු. 708,522,878.89 කි. සිමාසහිත එසුෆාලි (Esufalie) සමාගම සිය උසාවි නඩු හයේ වන්දි මුදල සඳහා ශ්‍රී ලංකා රුපියල් 500,000,000.00 ක වටිනාකමක් භාර ගැනීමට අවසානයේදී එකඟ විය. සිමාසහිත එසුෆාලි (Esufalie) සමාගම වෙත රු. 500,000,000.00 ගෙවීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා, ජනවාරි මාසය තුළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අමාත්‍ය මණ්ඩල වෙත ඉදිරිපත් කර ඇත. නමුත් මේ දක්වා ඉහත නිරවුල් කිරීමට අදාළව අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී නැත. ඉහත මුදල නිරවුල් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් යථා කාලයේදී තීරණයක් ගන්නේනම්, කොමිෂන් සභාවට සිමාසහිත එසුෆාලි (Esufalie) සමාගම වෙත ශ්‍රී ලංකා රුපියල් රු. 500,000,000.00 ගෙවීම කළ යුතුව ඇත.

අසම්භාව්‍ය බැරකම්

අනාගතයේදී කොමිෂන් සභාවේ බැඳීමට අනුව පසුගිය සහ වර්තමාන නීතිමය ක්‍රියාමාර්ග කිහිපයක් කොමිෂන් සභාව තක්සේරු කර ඇති අතර, සටහන් අංක 22 හි එකී ඇස්තමේන්තුගත අසම්භාව්‍ය බැරකම වන රු.164,000,000.00 ක් බාහිර පාර්ශවයන්ට ගෙවීමට කොමිෂන් සභාවට සිදුවිය හැකිය. නමුත් නීතිමය අලාභ සිදුවීමේ හැකියාව 50%ට වඩා අඩු බැවින් එම වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ගලපා නොමැති අතර, මූල්‍ය ප්‍රකාශවලට සටහන් ලෙස පමණක් අනාවරණය කරන ලදී.

අසම්භෘව්‍ය වත්කම්

අනාගතයේදී බාහිර පාර්ශවයන්ට එරෙහිව කොමිෂන් සභාව විසින් ගන්නා පසුගිය සහ වර්තමාන නීතිමය ක්‍රියාමාර්ග කිහිපයක් කොමිෂන් සභාව තක්සේරු කර ඇති අතර, සටහන් අංක 22 හි එකී ඇස්තමේන්තුගත අසම්භාව්‍ය වත්කම වන රු.43,398,475.00 ක් බාහිර පාර්ශවයන්ගෙන් කොමිෂන් සභාවට ලැබිය හැකිය. නමුත් නීතිමය අලාභ සිදුවීමේ හැකියාව 50%ට වඩා අඩු බැවින් එම වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ගලපා නොමැති අතර, මූල්‍ය ප්‍රකාශවලට සටහන් ලෙස පමණක් අනාවරණය කරන ලදී.

වෙන් කිරීම්

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස කොමිෂන් සභාවට නෛතික හෝ ව්‍යවස්ථාපිත බැඳීමක් ඇති සහ එම බැඳීම පියවීමට වත්කම් ගලායාමක් අවශ්‍යවියහැකි සහ එම බැඳීම පහසුවෙන් මැනිය හැකි අවස්ථාවේදී මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වෙන් කිරීමක් හඳුනා ගනී.

ගෙවිය යුතු වන්දි අත්හිටුවීම්

ගෙවිය යුතු වන්දි අත්හිටුවීම් අදියර එක.

1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ සහ පසුව කොමිෂන් සභාවේ කාලීන සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතා මත පදනම් වී අවස්ථා කිහිපයකදී එම පනතේ සංශෝධන යටතේ කොමිෂන් සභාවට ඉඩම් අයත් විය. පුද්ගලික, පවුල්, සහ සංවිධාන හා ආයතනවලට අයත් ඉඩම් පිළිබඳ ප්‍රකාශ කරන ලද පුද්ගලයින්ට වන්දි මුදල් ගෙවීමට කොමිෂන් සභාවට සිදු විය. 1974 වසරේ සිට සහ ඉදිරියට පුද්ගලික, පවුල්, සහ සංවිධාන හා ආයතනවලට ඉහත හිමි වූ ඉඩම් අදියර එක වන්දි මුදල් ගෙවීම තුළ කොමිෂන් සභාව දැනට රු. 1,495,000,000.00 න් රු. 1,389,337,130.67 ක් ගෙවා ඇත. මෙම වන්දි මුදල් ගෙවීම් අත්හිටුවීම් අදියර එක ගෙවීම් වර්තමානයේ සක්‍රීය තත්ත්වයේ පවතී. අදියර එක වන්දි මුදල් ගෙවීම් සාරාංශය සඳහා සටහන අංක 23 බලන්න.

ගෙවිය යුතු වන්දි අත්හිටුවීම් අදියර දෙක.

වන්දි මුදල් අත්හිටුවීම් අදියර දෙක යටතේ රුපියල් සමාගම් සහ ස්ටර්ලින් පවුම් සමාගම්වලින් කොමිෂන් සභාවට අයත් වූ ඉඩම් සඳහා ගෙවීමට අවධානය යොමු කරන ලදී. වන්දි මුදල් අදියර දෙක ගෙවීමේ ක්‍රියාවලිය 1985 සිට 2004 දක්වා කාලය තුළ ආරම්භ කරන ලදී. එම කාලසීමාව තුළ, කොමිෂන් සභාව විසින් රු. 1,250,000,000.00 න් රු. 1,140,040,507.05 ක් ගෙවා ඇත. අවසාන ගෙවීම 2004 වසරේදි සිදුකරන ලදී. මෙම අදියර දෙකවන්දි මුදල් ගෙවීම වර්තමානයේ අක්‍රිය තත්ත්වයේ පවතී. අදියර දෙක වන්දි මුදල් ගෙවීම් සාරාංශය සඳහා සටහන අංක 24 බලන්න.

සේවක නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම.

ඇගයීමේ ක්‍රමය සහ ආයුගණක උපකල්පන

කොමිෂන් සභාවේ පශ්චාත්-සේවක ප්‍රතිලාභ (පාරිතෝෂික) ගණනය කිරීම සඳහා, ඇක්චූරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙතින් වෘත්තීමය උපදේශන සේවාව ලබාගෙන ඇත. සේවා සපයන්නාගේ තක්සේරුව SLPSAS–19 හි සඳහන් පරිදි ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය භාවිතයෙන් සිදු කර ඇත. තක්සේරුව සඳහා යෙදාගත් ආයුගණක උපකල්පන 2 කොටසේ ඔවුන්ගේ ආයුගණක වාර්තාවේ විස්තරාත්මකව සාකච්ඡා කර ඇත.

ගිණුම්කරණ අනාවරණ සහ නිර්දේශය

පහත සඳහන් අනාවරණ කොමිෂන් සභාවේ 2023 මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත.

2023 දෙසැම්බර් 31 දිනට බැඳීමේ වර්තමාන වටිනාකම රු. 148,284,942.46.

2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හඳුනාගත් ශුද්ධ වගකීම රු. 148,284,942.46

විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගත් ප්‍රමාණය රු. 9,597,720.22.

2023 දෙසැම්බර් 31 දිනට නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන වටිනාකම (PVDBO) රු. 148,284,942.46.

2022 දෙසැම්බර් 31 දිනට නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන වටිනාකම (PVDBO) රු. 147,661,957.25.

නිශ්චිත දායක සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තියන්ගේ භාර අරමුදල

අදාළ ව්‍යවස්ථා සහ රෙගුලාසිවලට අනුව සේවකයින් සේවක අර්ථසාධක අරමුදලේ දායකමුදල් සහ සේවා නියුක්තියන්ගේ භාර අරමුදලේ දායක මුදල් සඳහා සුදුසුකම් ලබයි. මේවා විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ දරා ඇති පරිදි වියදමක් ලෙස හඳුනා ගනී. කොමිෂන් සභාව පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තියන්ගේ භාර අරමුදලට සේවකයින්ගේ ජීවන වියදම් දීමනාව සහිත මූලික වැටුපෙන් 15%ක් සහ 3%ක් දායක මුදල් ගෙවනු ලබයි.

බදුකරණය

ආදායම් බදු

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 126 වගන්තිය යටතේ කොමිෂන් සභාවේ අතිරික්තය සහ ආදායම ආදායම් බදු සඳහා යටත් වේ.

වෙනත් බදු

කොමිෂන් සභාව විසින් ලබාගන්නා කල්බදු ඉඩම් කුලී සහ වෙනත් සේවා ගාස්තු සම්බන්ධයෙන් එකතුකළ අගය මත බදු (VAT) සමාජ ආරක්ෂණ දායක බදු (SSCL) ගෙවන ලදී. කොමිෂන් සභාව විසින් කාලීනව රඳවා ගැනීමේ බදු (WHT) අඩු කළයුතු වියදම් ගෙවන අවස්ථාවලදී, කොමිෂන් සභාව බදු නියෝජිතයෙක් ලෙස රඳවා ගැනීමේ බදු එකතු කරනු ලැබේ.

විලම්භිත බදුකරණය

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 126 වගන්තිය යටතේ කොමිෂන් සභාවේ අතිරික්තය සහ ආදායම මත විලම්භිත බදු සඳහා වෙන් කිරීම් සිදුකර නොමැත. එබැවින් කොමිෂන් සභාවේ මුදල් වර්ෂය (ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දක්වා) මත පදනම් වී සංස්ථාපිත ආදායම් බදු ගෙවීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් අවසරය සඳහා ඉල්ලීමක් සිදු කර ඇත.

රජයේ දායක මුදල්, භාණ්ඩාගාර ප්‍රදාන සහ භාණ්ඩාගාරයට සෘජු ප්‍රේෂණ

මූලිකවම, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව ස්ථාපිත අදියරේදී රජයේ දායක මුදලක් ලෙස ශ්‍රී ලංකා භාණ්ඩාගාරය රු. 15.000,000/-ක් ලබා දෙන ලද අතර, පසුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ මෙහෙයුම් කටයුතු සඳහා දැරීමට මහා භාණ්ඩාගාරය විසින් ශ්‍රී ලංකා රු. 1,949,075,000/-ක් ප්‍රදානය කරන ලදී. ඉහත භාණ්ඩාගාර දායක මුදල් අවස්ථා දෙක හැර, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව රජයේ අරමුදල් ලබා ගැනීමක් නොමැතිව කොමිෂන් සභාව විසින් උත්පාදනය කළ අරමුදල් භාවිතා කරමින් පවත්වාගෙන යනු ලබයි. 2021 වසර තුළ, කොමිෂන් සභාව විසින් පසුව 2021 ජූලි 16 දින සහ 2021 දෙසැම්බර් 29 දින මහා භාණ්ඩාගාරය වෙත රු. 350,000,000 ක් සහ රු.750,000,000 ක් සෘජු ප්‍රේෂණ ලෙස ලබාදී ඇත. එමෙන්ම, 2023 වසර තුළ, කොමිෂන් සභාව විසින් 2023 සැප්තැම්බර් 19 දින හා දෙසැම්බර් 27 දින රු. 250,000,000.00 සහ රු. 100,000,000.00 මහා භාණ්ඩාගාරය වෙත ගෙවා ඇත.

විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙන් සංචිත වෙන් කිරීම

ඉඩම් විකිණීම, කුඹුරු ඉඩම් විකිණීම සහ ඉඩම් අත්කරගැනීමෙන් උත්පාදනය වන වාර්ෂික ආදායමෙන් 40%ක වටිනාකම කොමිෂන් සභාව සඳහා හිමි වූ ඉඩම් සඳහා ගෙවීමට අවශ්‍යවන කොමිෂන් සභාවේ මුල් ඉඩම් ප්‍රකාශකයින් වෙත වන්දි මුදල් ගෙවීමේ අරමුණ සඳහා පවත්නා සංචිතයට මාරු කරන ලදී. එමෙන්ම, මෙම සංචිතය කොමිෂන් සභාවට එරෙහිව අධිකරණ විනිශ්චයන් විසින් ලබාදෙන අධිකරණ වන්දි මුදල් ගෙවීම සඳහා ද භාවිතා කළ හැකිය.

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

වගුව 9 : 2023.12.31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය			
විස්තරය	සටහන්	31.12.2023	31.12.2022
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල පිරියත හා උපකරණ	3	65,406,396.29	81,458,947.52
අස්පෘශ්‍ය වත්කම්			
පරිගණක මෘදුකාංගය	3	1,625,231.74	3,668,351.52
මුළු ජංගම නොවන වත්කම්		**67,031,628.03**	**85,127,299.04**
අයෝජන වත්කම්			
1972 අංක 01 දරන පනත යටතේ පවරන ලද ඉඩම්	4	905,285,000.00	676,169,345.33
ජංගම වත්කම්			
තොග - ලිපිද්‍රව්‍ය	5	8,670,147.59	6,966,185.00
වෙලඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	6	4,002,737,774.08	3,561,131,052.00
ලැබිය යුතු පොලි	7	140,948,662.16	126,962,698.21
තැන්පතු හා අත්තිකාරම්	8	86,586,139.86	81,149,121.88
කෙටි කාලීන බැංකු තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත්	9	1,602,304,988.34	1,569,384,481.68
මුදල්, මුදල් හා සමාන දෑ	10	51,166,244.51	23,473,047.96
මුළු ජංගම වත්කම්		**5,892,413,956.54**	**5,369,066,586.73**
මුළු වත්කම්		**6,864,730,584.57**	**6,130,363,231.10**
වගකීම්			
සමුච්චිත අරමුදල් හා සංචිත			
සංචිත	11	2,214,606,103.30	2,000,490,415.85
ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන සංචිතය		286,401,967.55	57,286,312.88
ස්ථාවර වත්කම් පරිත්‍යාග සංචිත		324,881.06	693,650.99
සමුච්චිත අතිරික්තය		2,116,741,864.69	2,613,924,614.87
මුළු සමුච්චිත අරමුදල් හා සංචිත		**4,618,074,816.60**	**4,672,394,994.59**
අරමුදල් සහ ප්‍රධාන			
රජයේ දායකත්වය හා භාණ්ඩාගාර ප්‍රධාන	12	514,075,000.00	864,075,000.00
මුළු අරමුදල් සහ ප්‍රධාන		**514,075,000.00**	**864,075,000.00**
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික සඳහා වෙන් කිරීම්	13	148,284,942.46	147,661,957.24

ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික සඳහා වෙන් කිරීම්	13	148,284,942.46	147,661,957.24
වන්දි අවිනිශ්චිත ගිණුම - අදියර I	25	105,662,869.33	105,785,969.33
වන්දි අවිනිශ්චිත ගිණුම - අදියර II	26	109,959,492.95	109,959,492.95
මුළු ජංගම නොවන වගකීම්		363,907,304.74	363,407,419.52
ජංගම වගකීම්			
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ	14	717,806,610.83	223,943,668.49
ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු එකතු කළ අගය මත බදු		4,082,487.23	5,540,838.34
ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු සමාජ ආරක්ෂණ දායකත්ව		729,457.76	962,553.58
ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු රඳවා ගැනීමේ බදු		234,935.00	38,756.58
ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත උපයන විට ගෙවිය යුතු බදු		26,717,76	-
ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු ආදායම් බදු	15	645,793,254.65	-
මුළු ජංගම වගකීම්		**1,368,673,463.23**	**230,485,816.99**
මුළු වගකීම්		**1,732,580,767.97**	**593,893,236.51**
මුළු අරමුදල් සහ වගකීම්		**6,864,730,584.57**	**6,130,363,231.10**

ඉහත පිටු අංක 12 සිට 17 දක්වා දැක්වෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත්තේ සහ ඉදිරිපත් කර ඇත්තේ ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව බව සහතික කරමි. මෙම ප්‍රමිති නිකුත් කර ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිත කමිටුව මගිනි.

.....

එස්.පී.එස්.සේනානායක
අධ්‍යක්ෂ/මුදල්
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

එස්. පී. එස්. සේනානායක
අධ්‍යක්ෂ/මුදල්
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
අංක. 475, කඩුවෙල පාර,
බත්තරමුල්ල.

.....

නීතිඥ පණ්ඩුක කීර්තිනන්ද
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

නීතිඥ පණ්ඩුක කීර්තිනන්ද
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
නො. 475, කඩුවෙල පාර,
බත්තරමුල්ල.

.....

එච්.එම්.බී.පී. හේරත්
ලේකම්
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශ

එච්.එම්.බී.පී. හේරත්
ලේකම්
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය
"ලිබියාන මැදුර"
ඉඩම් මහලේකම්ගේ කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

3.3 විස්තීරණ ආදායම් ප්‍රකාශනය

වගුව 10 : 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය			
විස්තරය	සටහන්	**31.12.2023**	**31.12.2022**
ආදායම	16	835,065,640.29	945,566,320.17
වෙනත් මෙහෙයුම් ආදායම්	17	81,501,055.78	(8,425,084.79)
පරිපාලන වියදම්	18	(523,559,520.51)	(514,059,653.81)
සැපයුම් සහ අවශ්‍ය වියදම්	19	(38,073,617.73)	(34,837,588.08)
අනෙකුත් මෙහෙයුම් වියදම්	20	(47,900,917.06)	(40,874,049.37)
මෙහෙයුම් අතිරික්තය		**307,032,640.77**	**347,370,034.12**
මූල්‍ය ආදායම්	21	347,553,411.36	171,803,407.04
මූල්‍ය වියදම්	22	(18,535,308.07)	(973,481.28)
බදු පෙර අතිරික්තය		**636,050,744.06**	**518,199,959.88**
සංස්ථාපිත ආදායම් බදු	15	(197,395,710.57)	
බදු පසු අතිරික්තය		**438,655,033.49**	**518,199,959.88**
2023.01.01 දිනට මුළු විස්තීරණ ආදායම		2,613,924,614.87	2,090,449,092.07
ඉඩම් අත්පත් කරගැනීම, ඉඩම් විකිණීම, කුඹුරු ඉඩම් විකිණීම් වලින් 40% ක සංචිතය		(214,115,687.45)	(261,117,660.84)
පෙර වර්ෂය සඳහා ගැලපීම්	23	(721,722,096.22)	266,393,223.76
2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බදු පසු මුළු විස්තීරණ ආදායම		**2,116,741,864.69**	**2,613,924,614.87**

3.4 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

වගුව 11 : 2023.12.31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය			
විස්තරය	සටහන්	31.12.2023	31.12.2022
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ලද මුදල් ප්‍රවාහය			
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් අතිරික්තය		636,050,744.06	518,199,959.88
ගැලපුම්:			
ක්ෂය කිරීම්	18	19,412,014.91	19,365,996.95
පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන	18.1	9,597,720.22	6,698,941.24
ආයෝජන ආදායම	21	(347,553,411.36)	(171,803,407.04)
මූල්‍ය ආදායම	16	(2,930,914.72)	(2,505,283.66)
මූල්‍ය වියදම	22	18,535,308.07	973,481.28
ස්ථාවර වත්කම් බැහැර කිරීමේ ලාභය/අලාභය	17	116,861.71	193,942.09
පෙර වර්ෂය සඳහා ගැලපීම්	23	(273,324,552.14)	266,388,973.76
කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය		**59,903,770.75**	**637,512,604.50**
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්			
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ අඩුවීම හෝ වැඩිවීම		493,476,911.58	76,546,341.82
තොගය අඩුවීම් හෝ වැඩිවීම්		(1,703,962.59)	(3,469,434.70)
වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ අඩුවීම හෝ වැඩිවීම		(441,606,722.08)	(581,647,801.59)
තැන්පතු හා අත්තිකාරම් අඩුවීම හෝ වැඩිවීම		(5,437,017.98)	7,264,500.59
මෙහෙයුම් ක්‍රියාකරකම් තුලින් ජනනය කරන මුදල් ප්‍රවාහය		**104,632,979.68**	**136,206,210.62**
පාරිතෝෂික ගෙවීම		(10,057,255.00)	(6,705,213.58)
වන්දි ගෙවීම		(123,100.00)	(169,057.18)
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ලද ශු. මුදල් ප්‍රවාහය		**94,452,624.68**	**129,331,939.86**
ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ලද මුදල් ප්‍රවාහය			
දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම	3	(2,073,182.54)	(2,756,676.50)
ස්ථාවර තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත් ආයෝජන		(723,495,068.02)	(730,649,107.50)
ස්ථාවර තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත් වසා දැමීම		660,574,561.36	346,017,763.93
ආයෝජන ආදායම		333,567,447.41	73,644,396.19

වෙන්දේසි කිරීම් හා වත්කම් බැහැර කිරීම මගින් ලද මුදල්		271,207.00	76,970.00
ලද මූල්‍ය ආදායම		2,930,914.72	2,505,283.66
ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		**271,775,879.93**	**(311,161,370.22)**
මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය			
භාණ්ඩාගාරයට මුදල් යැවීම	12	(350,000,000.00)	-
මූල්‍ය පිරිවැය	22	(18,535,308.07)	(973,481.28)
මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ලද මුදල් ප්‍රවාහය		**(368,535,308.07)**	**(973,481.28)**
මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ වෙනස්වීම		(2,306,803.46)	(182,802,911.64)
වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් සමාන දෑ		83,473,047.97	266,275,959.61
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ		**81,166,244.51**	**83,473,047.97**

3.5 ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

වගුව 12. 2023.12.31 දිනට ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය					
විස්තරය	රජයේ දායකත්වය රු.	භාණ්ඩාගාර ප්‍රධාන රු.	ප්‍රාග්ධන සංචිත රු.	වෙනත් සමුච්චිත ආදායම් සංචිතය රු.	එකතුව රු.
2022.01.01 දිනට ආරම්භක ශේෂය	**15,000,000.00**	**849,075,000.00**	**1,797,691,735.09**	**2,248,995,381.77**	**4,910,762,116.86**
වර්ෂය සඳහා බදු පෙර ලාභය				518,199,959.88	518,199,959.88
භාණ්ඩාරයට මුදල් යැවීම					
සංචිත දායකත්වය			261,117,660.84		261,117,660.84
පෙර වර්ෂය සඳහා ගැලපීම්				266,393,223.76	266,393,223.76
2022.12.31 අවසාන දිනට ශේෂය	**15,000,000.00**	**849,075,000.00**	**2,058,809,395.93**	**3,033,588,565.41**	**5,956,472,961.34**
2023.01.01 දිනට ආරම්භක ශේෂය	15,000,000.00	849,075,000.00	2,058,809,395.93	3,033,588,565.41	5,956,472,961.34
වර්ෂය සඳහා බදු පසු ලාභය				438,655,033.49	438,655,033.49
භාණ්ඩාගාරයට මුදල් යැවීම		(350,000,000.00)			(350,000,000.00)
සංචිත දායකත්වය			214,115,687.45		214,115,687.45
ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය හා පරිත්‍යාග සංචිත			228,746,884.74		228,746,884.74
පෙර වර්ෂය සඳහා ගැලපීම්				(721,722,096.22)	(721,722,096.22)
2023.12.31 අවසාන දිනට ශේෂය	**15,000,000.00**	**499,075,000.00**	**2,501,671,968.12**	**2,750,521,502.68**	**5,766,268,470.80**

3.6 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

13 වගුව මඟින් 2023 වර්ෂයේ කොමිෂන් සභාව වෙත භෞතික සම්පත් අත්පත් කරගැනීම සහ බැහැර කිරීම පිළිබඳ තොරතුරු දක්වා ඇත.

වගුව 13: 2023.12.31 දිනට ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය					
වත්කම් කේතය	කේත විස්තරය	**31.12.2023** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**31.12.2023** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
1.	ගොඩනැගිලි හා ව්‍යුහයන්	26,749,400.00	26,749,400.00	-	-
2.	යන්ත්‍රෝපකරණ	55,862,787.81	55,862,787.81	-	-
3.	ඉඩම්	-	905,285,000.00	-	-
4.	අස්පෘශ්‍ය වත්කම්	10,215,604.88	10,215,604.88	-	-
5.	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
6.	කෙරිගෙන යන වැඩ	-	-	-	-
7.	බදු දෙන ලද වත්කම්	-	-	-	-

4. විගණකාධිපතිවරයාගේ වාර්තාව

A. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ **2023** දෙසැම්බර් **31** වන දිනෙන් අවසන් වර්ෂය වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව **(ඇමුණුම 01).**

5. කාර්ය සාධන දර්ශක

5.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

වගුව 14 : 2023.12.31 දිනට කාර්ය සාධන දර්ශකය				
අනු අංකය	විශේෂිත දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
		100-90%	75-89%	50-74%
1.	ආහාර සුරක්ෂිතතාවය වර්ධනය කිරීම සඳහා කෙටිකාලීන බෝග වගාව වෙනුවෙන් ඉඩම් ලබා දීම.	56%	-	-
2.	කෘෂිකාර්මික කටයුතු සඳහා ඉඩම් ලබාදීම. - භුක්තිය භාරදීම් - බදු ඔප්පු ලබාදීම්	104%	-	-
3.	කර්මාන්ත අමාත්‍යාංශ ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීම.	100%	-	-
4.	ඛනිජ සම්පත් ආශ්‍රිත ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීම.	-	-	50%
5.	කාර්යාල විගණනය	-	-	50%
6.	විගණන සැලැස්මට අනුව අභ්‍යන්තර විගණන විමසුම් නිකුත් කිරීම.			
7.	ආයතනික විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්	100%		

6. තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

6.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

වගුව 15 : 2023.12.31 දිනට ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය						
අනු අංකය	ඉලක්කය/අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
				0-49%	50-74%	75-100%
1.	සියළු ආකාරයේ දිළිඳු බව, සියළු තැන්හිම දුරු කිරීම. - නිවාස අරමුණු සඳහා ඉඩම් ඔප්පු ලබාදීම.	15000	934	6.22%	-	-
1.	කුසගින්න දුරලීම, ආහාර සුරක්ෂිතතාව හා ඉහළ පෝෂණයක් අත්පත් කරගැනීම සහ තිරසාර කෘෂිකර්ම ප්‍රවර්ධනය කිරීම. - කෘෂිකාර්මික කටයුතු සඳහා ඉඩම් ලබාදීම. (බලපත්‍ර ප්‍රමාණය) - ආහාර සුරක්ෂිතතාව වර්ධනය කිරීම සඳහා කෙටිකාලීන බෝග වගාව වෙනුවෙන් ඉඩම් ලබාදීම (බලපත්‍ර ප්‍රමාණය).	50 50	52 28		56%	104%
2.	දරාගත හැකි, අන්තර්ග්‍රහණීය සහ තිරසාර ආර්ථික වර්ධනයක් සම්පූර්ණ හා ඵලදායී රැකියාවත් හා සැමට ගෞරවාන්විත වෘත්තියක් ලැබීම ප්‍රවර්ධනය කිරීම. - පුහුණු වැඩසටහන් පැවැත්වීම.	10	08			80%
2.	ප්‍රත්‍යස්ථ වූ යටිතල පහසුකම් තැනීම, අන්තර්ග්‍රහණය හා තිරසාර කාර්මිකරණයක් ප්‍රවර්ධනය, නවෝත්පාදන ධෛර්මත් කිරීම. - කර්මාන්ත අමාත්‍යාංශ ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීම.	10	10			100%

7. මානව සම්පත් පැනිකඩ

7.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

වගුව 16 : කාර්ය මණ්ඩල සංයුතිය			
	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	39	35	04
තෘතියික	03	02	01
ද්විතියික	289	361	(72)
ප්‍රාථමික	61	69	08

7.2 මානව සම්පත් සංවර්ධනය

වගුව 17 : පුහුණු කිරීමේ වැඩසටහන්

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම
			දේශීය	විදේශීය		
කාර්යාල ක්‍රමවේද	130	දින 01	388,010	-	දේශීය	කාර්යාල ක්‍රමවේදය පිළිබඳව දැනුමක් ලබාගැනීමට හැකිවීම.
කාර්යාල ක්‍රමවේදය	150	දින 01			දේශීය	කාර්යාල ක්‍රමවේදය පිළිබඳව දැනුමක් ලබාගැනීමට හැකිවීම.
රියදුරන් සඳහා පුහුණු වැඩමුළුව	14	දින 01	2,700		දේශීය	මාර්ග සංඥා, නීති රීති පිළිබඳව දැනුමක් ලබා ගැනීමට හැකිවීම.
කාර්යාල සහයකයින් සඳහා	27	දින 01	24,910		දේශීය	කාර්යාලය තුළ වැඩ කටයුතු කරන්නේ කෙසේද, ඔවුන් සතු රාජකාරි
ප්‍රසම්පාදන පිළිබඳව	01	දින 01	7,000		දේශීය	ප්‍රසම්පාදන කටයුතු සිදුකරන්නේ කෙසේද, එයට අදාළ වක්‍ර ලේඛ මොනවාද යන්න පිළිබඳව මනා දැනුමක් ලබා ගැනීමට හැකිවීම.
පරිපාලන නිලධාරි සතු වගකීම්	01	දින 02	7,500		දේශීය	ආයතනයක පරිපාලන කටයුතු සිදුකරන්නේ කෙසේද, පරිපාලන නිලධාරියෙකු සතු වගකීම් හා රාජකාරි කටයුතු පිළිබඳව දැනුමක් ලබා ගැනීමට හැකිවීම.

ගබඩා කළමනාකරණය හා මිලදී ගැනීම්	01	දින 01	9,500		දේශීය	ආයතනයේ ලිපිද්‍රව්‍ය ගබඩා කර තබන්නේ කෙසේද, ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම සිදුකල යුත්තේ කෙසේද, ගබඩාව කළමනාකරණය කරන්නේ කෙසේද යන්න පිළිබඳව දැනුමක් ලබා ගැනීමට හැකිවීම.
ජායාරූපකරණය	01	මාස 03	44,000		දේශීය	ජායාරූපකරණය පිළිබඳව මනා දැනුමක් ලබා ගැනීමට හැකි වීම.

8. අනුකූලතා වාර්තාව

වගුව 18 : අනුකූලතා වාර්තාව				
අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1.	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
2.	පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම. (මු.රෙ.445)			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.2.	පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙනද යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.5	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.6	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.8	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		

03	මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම. (මු.රෙ.135)			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම.	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම.	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම.	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ		
4.	**වාර්ෂික සැලසුම් සකස් කිරීම.**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (PED) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
5.	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම.	අනුකූල වේ		

6	අභ්‍යන්තර විගණනය			
6.1	මු.රෙ 134 (2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම.	අනුකූල නොවේ		පිළිතුරු ලබාදීම ප්‍රමාදවීම සම්බන්ධව ආයතනික විගණන හා කළමනාකරණ කමිටුවේදී සාකච්ඡා වේ.
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
7.	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම.	අනුකූල වේ		
8.	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		

8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම.	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම.	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම.	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට අඩු කාලයක දී අපහරණය කර තිබීම.	අනුකූල නොවේ.		එක් වාහනයක් ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුව අළුත්වැඩියා කිරීමට කටයුතු කරමින් සිටියද යාන්ත්‍රික ඉංජිනේරු විසින් ලබා දුන් නිර්දේශය අනුව, එය අළුත්වැඩියා කිරීම සුදුසු නොවන බව හා විධිමත් වෙන්දේසියකින් ඉවත් කිරීම සුදුසු බව නිර්දේශ කරන ඇත.

				ඒ අනුව, අදාළ ඉදිරි කටයුතු සිදුකරමින් පවති.
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
11	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
11.1	සීමාවන්ට වලට අනුකූල වීම	අනුකූල වේ		

11.2	හිඟවිම් ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම.	අනුකූල වේ		
11.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
12	**ආදායම් ගිණුම**			
12.1	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
13	**මානව සම්පත් කළමනාකරණය**			
13.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම.	අනුකූල නොවේ		මේ සම්බන්ධව අමාත්‍ය මණ්ඩල තීරණයක් හා කොමිෂන් සභා තීරණයක් ගෙන ඇති අතර, කාර්යය මණ්ඩලය අනුමත කාර්යය මණ්ඩලය වෙත ඇතුළත් කර ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් නැවත ඉදිරිපත් කර ඇත.
13.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම.	අනුකූල වේ		
13.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
14	**මහජනයා වෙත තොරතුරු ලබා දීම.**			
14.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියකු පත්කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
14.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබාදී නිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා	අනුකූල වේ		

	ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.			
14.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්තිය ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
15	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.**			
15.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
15.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ		
15.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ		
15.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදයේ ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම.	අනුකූල වේ		

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. ARI/E/LRC/FA/01/2023/20 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2024 සැප්තැම්බර්30දින

සභාපති

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය ව්‍යාවනය

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

1.2 මතය ව්‍යාවනය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රමිත අංක 19 හි 141 (අ) වගන්තිය ප්‍රකාරව ආයු ගණක ප්‍රතිලාභ සහ අලාභ හදුනා ගැනීම් සඳහා වූ අස්ථීත්වයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයේ ප්‍රාරම්භක සංචිත ශේෂය රු.2,501,671,968 ක් හා රඳවාගත් ඉපැයුම් ශේෂය රු.2,750,521,503 ක් වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

රු. 2,501,332,952 ක් හා රු. 2,116,741,865 ක් වූයෙන් රු.339,952 ක් හා රු.633,779,638 ක ලෙස එකතුව රු.634,118,654 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) ඉඩම් විකුණුම්, කුඹුරු ඉඩම් විකුණුම් සහ ඉඩම් අත්පත් ආදායම් වලින් සියයට 40 ක වටිනාකම වූ රු.214,115,687 ක් ප්‍රාග්ධන සංචිත ගිණුමට බැර කර තිබුණ ද එම වටිනාකම රඳවාගත් ඉපැයුම් ගිණුමෙන් අඩු කර නොතිබුණි.

(ඈ) ඉඩම් ලේඛණයට අනුව බදුදී ඇති ඉඩම් හෙක්ටයාර් 4833 ක් ඇතුළත්ව මුළු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 156,838 ක් වුවත් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල හෙක්ටයාර් 2,144 ක් (අක්කර 868 පර්චස් 6.9 ක් වූ ඉඩම් කැබලි 29) පමණක් තක්සේරු කර එහි වටිනාකම ලෙස රු. 905,285,000 ක් මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කර තිබුණි.එය ප්‍රතිශතයක් ලෙස සියයට 1.37 ක් විය. මේ අනුව ඉඩම්වල සාධාරණ අගය ගිණුම් මඟින් පිලිඹිබු නොවන අතර නිවැරදිතාවය සහ එම ඉඩම් වල සමස්ත වටිනාකම පිළිබඳ විගණනයට තහවුරු කර ගත නොහැකි විය.

(ඉ) ඉඩම් ප්‍රතිසංස්කරණ පනත ප්‍රකාරව,චතු සමාගම්වලින් සහ පුද්ගලයන්ගෙන් පවරාගත් ඉඩම් ලිපිගොනු 1,010 ක් සඳහා ගෙවිය යුතු චන්දි මුදලේ රු.215,622,362 ක් වූ ශේෂය (අදියර - I සහ II) අවිනිශ්චිත ගිණුමකට බැර කර තිබූ අතර ඒ පිළිබඳ විස්තර නොවූ අතර එය අයි හෝ ඌණ වෙන් කිරීමක් විය හැකි බව නිරීක්ෂණය විය.

(ඊ) මොනරාගල, රත්නපුර, පුත්තලම සහ ගාල්ල යන දිස්ත්‍රික් කාර්යාල ගොඩනැගිලි පිහිටි ඉඩම් සහ ලිදුල බංගලා ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ වටිනාකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි දේපළ, පිරියත හා උපකරණ වල දක්වා නොතිබුණි.

(උ) දෙල්තොට ප්‍රාදේශීය ලේකම් නිල නිවස සඳහා අත්පත් කරගත් ඉඩමේ වන්දි ලෙස කොමිෂන් සභාවට රු. 4,742,500 ක මුදලක් 2021 අප්‍රේල් 08 දින ලැබී ඇතත් එම වටිනාකම, ලැබිය යුතු ආදායමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඌ) ලිට්ල් වැලිවත්ත ඉඩමේ හෙක්ටයාර් 8.974 ක් අත්පත් කරගැනීම වෙනුවෙන් දෙල්තොට ප්‍රාදේශීය ලේකම් විසින් වන්දි ලෙස රු.18,786,000 ක් 2023 ඔක්තෝබර් 11 දින කොමිෂන් සභාවට ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂයේ එම වටිනාකම ලැබිය යුතු ශේෂයක් ලෙසද ගිණුම්ගත කර තිබුණි.

(එ) වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කැඩැස්තර සිතියම් අංක 620142 කලාප 02 කැබලි අංක 13 හි අක්කර 01 රූඩ් 03 ක කොමිෂන් සභාව සතු ඉඩම අත්පත් කර ගැනීම වෙනුවෙන් ලැබිය යුතු වන්දි පොලී මුදල වූ රු. 2,214,397 කින් 2023 වර්ෂයේදී ලැබුණු වන්දි පොලිය රු. 702,999 ක් ගිණුම් ගතකර ඇතත් තවදුරටත් ලැබිය යුතු වන්දි පොලිය වූ රු.1,511,398 ක් මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනා ගෙන නොතිබුණි.

(ඒ) වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මුල්ගල්කැලේ වත්ත නමැති ඉඩමේ මු.පි.නු 3362 දරන පිඹුරේ කැබලි අංක 02 හි හෙක්ටයාර් 0.4121 ඉඩම අත්පත් කරගැනීම වෙනුවෙන් වන්දි මුදල වූ රු. 18,900,000 ක් 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ලැබිය යුතු වන්දි ලෙස හඳුනා ගෙන තිබුණද අමතර වන්දි මුදල වූ රු.15,557,500 ආදායම් හා ණයගැතියන් ලෙස හඳුනාගෙන නොතිබුණි.

(ඔ) මොණරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කුමාර වත්ත ඉඩමෙහි හෙක්ටයාර් 0.3582 ක් ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය සඳහා අත්පත් කර ගැනීම වෙනුවෙන් ලද රු.4,954,000 ක වන්දි මුදල 2021 නොවැම්බර් 01 දින ලැබී එම වර්ෂයේ ගිණුම් ගතකර ඇතත්, ණයගැතියන්ගෙන් එම ශේෂය ඉවත් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ණයගැතියන් එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඕ) 2023 ජනවාරි 01 දිනට ලැබිය යුතු මුළු තක්සේරු මත සේවා ගාස්තු ආදායම වූ රු.5,374,478 ක් අදාළ වර්ෂ වල ආදායම ලෙස හඳුනා නොගෙන සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ප්‍රවර්තන වර්ෂයේ ලාභය එම වටිනාකමෙන් අධි තක්සේරු වී තිබුණි.

(ක) කළුගල් බදු ලෙජරය අනුව බදුකරුවන් 75 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින බදුකරුවන් 20 දෙනෙකුට අදාළ වාර්ෂික බදුකුලී ආදායම් ලෙස රු.10,458,366 ක් පමණක් උපචිත පදනම මත හඳුනාගෙන ඇතත්, ඉතිරි බදුකරුවන් 55 කට අදාළ උපචිත වාර්ෂික බදු ආදායම ගණනය කර මූල්‍ය ප්‍රකාශන තුළ ගිණුම්ගත කර නොතිබුණි.

(ග) ලැබිය යුතු ඉඩම් විකුණුම් ආදායමින් කොමිෂන් සභාවට රු.7,863,205 ක මුදලක් ලැබී තිබුණද ලැබිය යුතු ඉඩම් විකුණුම් ආදායමින් අඩු කර නොතිබුණි.

(ච) කොමිෂන් සභාව විසින් පොල් වගා කිරීමේ මණ්ඩලය වෙත බදු පදනම මත ලබාදී ඇති කුරුණෑගල දිස්ත්‍රික්කයේ සෙරපීස් වත්ත නැමති ඉඩමට අදාළ වාර්ෂික තක්සේරුව වූ රු.960,000 ක් මූල්‍ය ප්‍රකාශනවල රු.760,000 ක් ලෙස හඳුනාගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ බදුකුලී ආදායම හා ණයගැතියන් රු.200,000 කින් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි.

(ජ) කොමිෂන් සභාව විසින් පොල් වගා කිරීමේ මණ්ඩලය වෙත ගිවිසුම් නොමැතිව බදු පදනම මත ලබා දුන් ඉඩම් අක්කර 1,539 රූඩ් 02 පර්චස් 38.81 ක් වෙනුවෙන් අයවිය යුතු හිඟ බදු ආදායම ලෙස රු.354,658,614 ක් හඳුනාගෙන ඇතත් ඉතිරි ඉඩම් ප්‍රමාණය වන අක්කර 1,588 පර්චස් 11 කට අදාළව අයකර ගත යුතු බදු මුදල කොපමණද යන්න හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර නොතිබුණි.

(ට) ඉඩම් අමාත්‍යාංශය, ජනතා චතු සංවර්ධන මණ්ඩලය,ශ්‍රී ලංකා වැවිලි සංස්ථාවට අදාළව ලැබිය යුතු ශේෂවල එකතුව රු.2,072,166,351 ක් වුවද එම ආයතන වලින් කොමිෂන් සභාවට

ගෙවිය යුතු ශේෂයක් නොමැති බව දන්වා තිබුණද එම ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. ලැබිය යුතු බදු ශේෂ 36 ක් සඳහා රු.777,136,104 ක් සහ වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂ 15 කට අදාළ රු.6,305,291ක ශේෂ සඳහා සනාතන ලිපි වලින් තහවුරු නොවූ බැවින් නිවැරදිතාවය විගණනයට තහවුරු නොවීය.

(ඩ) එකතුව රු.4,002,737,774 ක් වූ වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂයෙහි ඇතුළත් රාජ්‍ය ආයතන 03 කින් ලැබිය යුතු වර්ෂ 30 ඉක්ම වූ රු.2,126,952,139 ක් සහ වර්ෂ 10 ඉක්ම වූ රු.381,076,216 ක් සඳහා කිසිදු වෙන්කිරීමක්ද කර නොතිබුණු අතර අයවීම අවිනිශ්චිත තත්වයේ විය.

(ත) පොල් වගා කිරීමේ මණ්ඩලය වෙත බදු දීම වෙනුවෙන් අයවිය යුතු පරිහරණ ගාස්තු ලෙස රු.31,688,608 ක් හඳුනාගෙන තිබුණද ලැබිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගෙන නොතිබුණි.

(ද) බදුල්ල දිස්ත්‍රික්කයේ කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි තල්පිටිය වත්ත නමැති ඉඩමේ අක්කර 04 ක තිරුවානා ගල, සහිත ඉඩමට අදාළ හිඟ බදු මුදල වූ රු.5,250,480 ක මුදල් අය වී නොතිබියදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කර තිබුණි.

ඉහත විස්තර කර ඇති පරිදි, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුළත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මගින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය. මේ හේතුවෙන්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසෙන වටිනාකම් හෝ අයිතමයන් වල වාර්තාගත හෝ වාර්තා නොකළ වටිනාකම් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් කිසියම් ගැලපීමක් කිරීමට අවශ්‍ය දැයි මට නිශ්චය කිරීමට නොහැකි විය.

1.3 කොමිෂන් සභාවේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් කොමිෂන් සභාවේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ.මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබාගත්විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ

විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම් කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාව අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය යැයි සැලකෙන සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා ලබාගෙන නොමැති අතර නිසි ගිණුම් වාර්තා සහාව තබා තිබේද යන්න තීරණය කිරීමට මට නොහැකි විය.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ 1.2 (ඇ), (ඉ), (ඊ) , (ට),(ඩ) යන ඡේදවල දැක්වෙන නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සභාවේ සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති/විධානයට යොමුව	නිරීක්ෂණය
(අ) 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 44(ඕ) වගන්තිය	(i). කොමිෂන් සභාව විසින් සේවයෙහි යොදවා ගෙන සිටින තැනැත්තන් සඳහා අර්ථ සාධක අරමුදලක් පිහිටුවීම හා සුභසාධන හා විනෝද ක්‍රීඩා පහසුකම් සහ නිවාස හා නේවාසිකාගාර හා වෙනත් ඉඩකඩ සැපයීම සිදුකල යුතුය යන්න පදනම්ව කොමිෂන් සභාවේ වසර 5 ක අඛණ්ඩ සේවයක් හිමි සේවක්යෙකු හට පර්චස් එකක් රු.1,000 ක වටිනාකමට පර්.20 බැගින් ලබා දීම කර තිබුණි.ඒ අනුව් 2009 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා නිලධාරින්

396 ක් වෙත ඉඩම් අක්කර 49 පර්චස් 35.64 ක් ලබා දී තිබුණි.

(ii). කොමිෂන් සභාව විසින් සේවයේ නියුතු වසර 10 කට වඩා සේවා කාලයක් ඇති සේවකයෙක් විශ්‍රාම ගැන්වීමේදී හා ඉල්ලා අස්වීමේදී සිහිවටනයක් ලෙස රන්පවුමක් ලබාදී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී සේවකයන් 20 කට රන්පවුම් ලබාදීම වෙනුවෙන් රු.5,060,000 ක වියදමක් දරා තිබුණද ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවීය.

(ආ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 10 හා 16 වන වගන්ති

කොමිෂන් සභාව විසින් 2021 වර්ෂයේ ආරම්භ කරන ලද කාබනික පොහොර වාහනියට බඳවාගත් සේවකයින්ගේ සේවක අර්ථසාධක අරමුදලට හෝ සේවක භාරකාර අරමුදලට් ගෙවිය යුතු රු.367,625 ක මුදලක් එම අරමුදල්වලට බැර නොකර කොමිෂන් සභාවේ 2023 මූල්‍ය ප්‍රකාශනයේ ගෙවිය යුතු ශේෂයක් ලෙස දක්වා තිබුණි.

(ඇ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය

මුදල් අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව ආයතනයේ ඇති අතිරික්ත මුදල්, ප්‍රති මිලදී ගැනුම් වල ආයෝජන,භාණ්ඩාගාර බිල්පත්, ස්ථාවර තැන්පතු හෝ වෙනත් ඕනෑම ආයෝජනයක් සිදු කළ හැකි වුවත් 2023 වර්ෂයේ සිදු කළ රු.2,540,580,496 ක් වූ ආයෝජන සඳහා එවැනි අනුමැතියක් ගෙන නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 1645 (අ)

කොමිෂන් සභාව සතු වාහන 12 ක වාහන ලොග් පොත් නිසියාකාරව යාවත්කාලීන කර පවත්වා නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ V වැනි පරිච්ඡේදයේ 1.1 ඡේදය

ආයතන සංග්‍රහට පටහැනිව 2020 ඔක්තෝම්බර් 23 දින සිට 2022 මාර්තු 31 දින දක්වා කොමිෂන් සභාවේ ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුරේ සේවය කරමින් සිටියදී, 2021 ජනවාරි 01 දින සිට මග නැගුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සමාගමේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) තනතුර සඳහා වසරක පරිවාස කාලයකට යටත්ව ස්ථිර පදනම මත සේවයට බැඳී එකම කාලය තුළ ආයතන 02 න්ම වැටුප් හා දීමනා ලබාගෙන තිබුණි. ඒ අනුව කොමිෂන් සභාව විසින් අදාළ නිලධාරියාගේ

		පැමිණීම සහ ලබාදෙන සේවය පිළිබඳව සැලකිලිමත් නොවී වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණු රු. 2,038,979 ක මුදල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විටත් අයකර ගෙන නොතිබුණි.
(ඊ)	අංක 22/විවිධ (063) හා 2022 නොවැම්බර් 22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය හා ජනාධිපති ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්ගේ 2023 මැයි 25 දිනැති අංක PS/PSB/AS-02/LAND/2023 දරන ලිපිය	ඉඩම් බැහැර කිරීමට අදාළ වන සියලුම කටයුතු වහාම ක්‍රියාත්මක වන පරිදි තාවකාලිකව අත්හිටුවීමට ජනාධිපතිතුමා විසින් නියම කර තිබුණද එම ලිපියේ නියමයන් අභිබවා 2023 මැයි 25 දිනෙන් පසුව ඉඩම් අක්කර 714 රූඩ් 5 පර්චර් 8.57 ක් බැහැර කර තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, පහත සඳහන් නිරීක්ෂණය හැර සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

සභාව සඳහා, පූර්ණ ඒකාබද්ධ පරිගණක පද්ධතියක් නිර්මාණය කිරීම, සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා 2002 වර්ෂයේ දී පෞද්ගලික සමාගමක් වෙත ගෙවා තිබුණු රු.17,000,000 ක මුදල නැවත ලබා ගැනීම සඳහා නෛතික ක්‍රියාමාර්ග ගන්නා ලෙස 2022 පැවති පොදු ව්‍යාපාර කාරක සභාවට දන්වා ඇතත් ඒ අනුව කටයුතු කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

2.3 **වෙනත් කරුණු**

(අ) මූල්‍ය ප්‍රකාශන වල විවිධ ණයගැතියන් යටතේ කළුතර සහ ගම්පහ දිස්ත්‍රික්ක දෙකෙහි පිහිටි ඉඩම් කැබලි 08 ක් බදුගත් පුද්ගලයින්ගෙන් අයවිය යුතු රු.2,311,017 ක් වර්ෂ 24 කට වැඩි කාලයක සිට හිඟව පැවතුණද,අදාළ බදු මුදල් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.11,322,992 ක් වූ ඉඩම් විකුණුම් අත්තිකාරම් ශේෂයෙහි වර්ෂ 10 කට වැඩි කාලයක සිට පවත්වාගෙන එන එකතුව රු.11,202,992 ක ශේෂ හා එකතුව රු.14,080,850 ක් වූ ඉඩම් බදුකුලී අත්තිකාරම් ගිණුම් ශේෂයේ ඇතුළත් පුද්ගලයින් 269 දෙනෙකුගෙන් ලබාගත් රු.11,215,850 ක අත්තිකාරම් මුදල් වර්ෂ 18 කට වැඩි කාලයක සිට රඳවාගෙන තිබුණ ද, අදාළ ඉඩම් නීත්‍යානුකූලව

විකිණීමට, බදු දීමට හෝ අත්තිකාරම් නැවත පියවීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි.

(ඇ) කොමිෂන් සභාවේ 2021 මාර්තු 15 දිනැති පාලන චක්‍රලේඛ අංක 2021/01 හි (ඉ) වගන්තිය අනුව 2015 ජනවාරි 01 දිනෙන් පසු සියලුම නව අනවසරකරුවන් නෙරපීම කළ යුතු අතර අංක 22/විවිධ (063) හා 2022 නොවැම්බර් 22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඉඩම් බැහැර කිරීම නතර කරන ලෙස දන්වා තිබුණද එයට පටහැනිව නොදියුණු තක්සේරු වටිනාකම වන රු.920,000 කට බදුල්ල දිස්ත්‍රික්කයේ හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි මුතුවාන වත්ත ඉඩමේ කැබලි අංක 01 හි අක්කර 02 පර්. 7.22 ක් වූ ඉඩමෙහි අනවසර පදිංචිකරුට විකිණීමෙන් පවරා දී තිබුණි.

(ඈ) භාණ්ඩාගාර ලේකම්ගේ 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන රාජ්‍ය වියදම් පාලන චක්‍රලේඛයේ 2 වන වගන්තිය ප්‍රකාරව ගොඩනැගිලි කුලියට ගැනීම නතර කළ යුතු බව දන්වා තිබුණද කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල 07 ක් කුලී පදනම මත පවත්වා ගෙන යාම වෙනුවෙන් 2022 හා 2023 වර්ෂ වලට අදාළව බදු කුලීය ලේඛ රු.49,571,072 ක් දරා තිබුණි. එසේම කොමිෂන් සභාව ආරම්භකර දැනට වසර 50 කට ආසන්න වුවත් කොමිෂන් සභාවට අයත් ගොඩනැගිලි වල කාර්යාල පිහිටුවීමට කටයුතු කිරීමට කළමනාකරණය අපොහොසත්වී ඇති බව ද තවදුරටත් නිරීක්ෂණය විය.

(ඉ) කොමිෂන් සභාව සතුව ගාල්ල කුරුදුගහ හැතැප්මේ පර්.31.5 ක ඉඩම සහිත ගොඩනැගිල්ලේ කොමිෂන් සභා ගාල්ල දිස්ත්‍රික් කාර්යාලය එහි පවත්වා ගෙන යාමට කටයුතු නොකර ගාල්ල නගරාසන්නයේ පිහිටි පර් 9.79 ක් වූ ගොඩනැගිල්ලක රු.65,000 ක් වූ මාසික බදු කුලියට ලබා ගෙන පවත්වා ගෙන යාම හේතුවෙන් 2018 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා දරා තිබුණු ගොඩනැගිලි කුලීය වූ රු.4,870,000 ක් නිශ්කාර්ය වියදමක් බව නිරීක්ෂණය විය.

(ඊ) 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු හිඟ ඉඩම් බදු වටිනාකම රු. 1,180,434,743 කට අදාළ බදුකරුවන් සංඛ්‍යාව 401 ක් වන අතර ඉන් බදුකරුවන් 116 කට පමණක් බදු ගිවිසුම් ලබාදී තිබූ අතර හිඟ බදු මුදල වූ රු. 904,486,633 කට අදාළ බදුකරුවන් 285 කට නීත්‍යානුකූලව ගිවිසුමකට එළඹීමකින් තොරව ඉඩම් බදු දී තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ හිඟ බදු මුදලින් අයකර ගත් වටිනාකම සියයට 13 ක් හා සමාලෝචිත වර්ෂයේ ආදායමින් අයකරගත් වටිනාකම සියයට 30 ක් වී තිබුණි. ඒ අනුව නීත්‍යානුකූල ගිවිසුම් නොමැතිව බදු දී ඇති නිසා හිඟ බදු මුදල් අයකර ගැනීම සඳහා නඩු මාර්ගයකට හෝ යාමට නොහැකිවී තිබුණි.

(උ) ඉඩම් ප්‍රතිසංස්කරණ පනත ප්‍රකාරව පුද්ගලික සමාගමක් සතු ටෙම්පල්ස්ටෝ වත්ත ඉඩම 1974 ජූලි 09 දින පවරාගෙන ඇතත් එම සමාගම විසින් පැවරු නඩුවේ තීන්දුව අනුව අක්කර 439 රූඩ් 02 පර්.03 ක ප්‍රමාණයක භුක්තිය 1993 නොවැම්බර් 23 දින නැවත සමාගම වෙත

හාරදී තිබුණි. සමාගමට 1974 සිට 1993 දක්වා කාලය සඳහා ඔවුන්ගේ අභිමිවූ ආදායම් සහ අහිමි වූ අලාභය සඳහා පොලිය සම්බන්ධව ගොනුකළ නඩුවට අදාළව ලබාදුන් නියෝගය ඉටු නොකිරීම නිසා 2001 වර්ෂයේදී ගෙවිය යුතු මුදල වූ මුදල රු.මිලියන 100 ක් එකී කාලයේදී නොගෙවීම හේතුවෙන් එම මුදලට වාර්ෂික පොළියද එකතුවීම නිසාවෙන් රු.මිලියන 500ක් ගෙවීමට එකඟ වී තිබුණි. ඒ අනුව රු.මිලියන 400 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණු බව නිරීක්ෂණය විය.

(උ) කොමිෂන් සභාවේ ඒකාබද්ධ ගිණුම්කරණ මෘදුකාංග.පද්ධතියක් 2019 මැයි 22 දින පුද්ගලික ආයතනයකින් රු.8,500,000 කට මිලදී ගෙන තිබුණ ද, එම තොරතුරු පද්ධතිය මගින් ලැබිය යුතු ඉඩම් බදු මුදල් පිළිබඳ තොරතුරු ලබාගැනීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් නොහැකි වී තිබුණි.

(ඵ) කොමිෂන් සභාවේ ඉඩම් මැනුම් කර නියමානුකූල කරන අවස්ථාවේ කට්ටි කරුවන්ගෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට යටත්ව මිනින්දෝරුවන් හට 2019,2020 හා 2021 යන වර්ෂ වලදී ගෙවා තිබුණු එකතුව රු.33,229,487 ක මුදලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විට රු.7,616,274 ක් පමණක් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණු අතර එදිනට තවදුරටත් ලැබිය යුතු ශේෂය රු.25,613,213 වේ.

(ඒ) කොමිෂන් සභාවට අයත් නාවලපිටිය ටිල්ටන් වත්ත ඉඩමේ තේ කර්මාන්ත ශාලාව සහිත අක්කර 02 රූඩ් 01 පර්චස් 05 ක ප්‍රමාණය තිස් අවුරුදු බදු පදනම මත 1997 අගෝස්තු 30 දින සිට වාර්ෂික බදු කුලිය රු.270,000 බැගින් පුද්ගලික සමාගම වෙත බදු දී තිබුණි. 2008 වර්ෂයේදී පුද්ගලික පාර්ශවයක් විසින් ඉහත ආයතනයේ වෙළඳනාමය සමඟ ඉඩම පවරා ගෙන ඇතත් මේ සම්බන්ධයෙන් අනුමැතියක් හා ගිවිසුමකට එළඹීමකින් තොරව හෝ කිසිදු අය කිරීමකින් තොරව අවිධිමත් ලෙස භුක්තිවිඳීමට කොමිෂන් සභාව විසින් ඉඩදී තිබූ අතර 2023 දෙසැම්බර් 31 දින දක්වා වසර 26 ක කාලයක සිට අයවිය යුතු බදු මුදල රු.18,403,926 ක් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඔ) ගාල්ල අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ලෙව්වමී බී වත්ත නැමැති ඉඩමෙන් අක්කර 08 ක් අවුරුදු 30 ක කාලයක් සඳහා "පදනමකට" බදු පදනම මත ලබා දී ඉඩමේ භුක්තිය ඒකපාර්ශ්විකව කොමිෂන් සභාව වෙත 2021 වර්ෂයේදී පවරාගෙන තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන දින වන විට හිඟව පැවති රු.6,998,800 ක මුදල අයකර ගැනීමට කොමිෂන් සභාව මේ දක්වා කටයුතු කර නොතිබුණි.

(ඕ) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු කළුතර දිස්ත්‍රික්කයේ හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාහේන උතුර 615 බී ග්‍රාම නිලධාරී වසමට අයත් ඉඩමෙහි නොබෙදූ අක්කර 14 රූඩ් 1 පර්චස් 9.9 ක ඉඩම තුළ අනවසර ලෙස ස්වාමීන් වහන්සේ නමක් අක්කර 5 කට ආසන්න ප්‍රමාණයක්ද, තවත් පෞද්ගලික ඉඩම් හිමිකාරියක් පර්චස් 66 ඉක්මවූ

ප්‍රමාණයක්ද භුක්ති විඳින අතර 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 16 වගන්තිය ප්‍රකාරව අනවසර භුක්තිකරුවන් නෙරපා හැරීමට නීතිමය කටයුතු කර නොතිබුණි.

(ක) කොළඹ දිස්ත්‍රික්කයේ කොළොන්නාව වැල්ලම්පිටිය ප්‍රදේශයේ පිහිටි ජා කොටුව වත්ත ඉඩමෙන් රූඩ් 01 පර්චස් 9.79 ප්‍රමාණය වාර්ෂික බදු කුලිය රු.1,590,000 ක් බැගින් පුද්ගලයෙකු වෙත පවරා ඉඩමේ වෙළඳපල වටිනාකම මත එය රු.26,500,000 කට තක්සේරු කර ඇතත් බදු කුලිය ඉතා ඉහළ අගයක් බැවින් එය ගෙවිය නොහැකි බව දන්වා තිබූ අතර මේ දක්වා කිසිදු බදු මුදලක් අය වී නොතිබුණි.

(ග) ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි රාගෙදර වත්ත ඉඩමෙන් අක්කර 70 ක් මිනිරන් කැනීම සඳහා රජයේ තක්සේරු වටිනාකම මත වර්ෂ 05 ක කාලයක් සඳහා පුද්ගලික සමාගමක් වෙත 2011 වර්ෂයේදී බදු දී තිබුණි. මෙම මිනිරන් සහිත ඉඩම සඳහා 2023 දෙසැම්බර් 31 දින දක්වා ගෙවූ මුදල රු. 8,110,356 ක් රජයේ තක්සේරුව ලබාගෙන නොතිබීම මත ලැබුණු අත්තිකාරම් ලෙස ගිණුම්ගත කර තිබුණි. මෙම විගනන වාර්තාවේ දින වන විටත් වර්ෂ 12 ක් පමණ ගතවී තිබුණද තක්සේරු කර බදු ගණනය කර අයකර ගැනීමට හා දෙපාර්ශවය අතර බදු ගිවිසුමකට එළඹීමට කොමිෂන් සභාව මේ දක්වා අපොහොසත් වී තිබුණි.

(ඝ) මහනුවර දිස්ත්‍රික්කයේ අම්බලන්වත්ත ඉඩමෙන් අක්කර 25 ක් පුද්ගලික සමාගමක් වෙත සිලිකා ව්‍යාපෘතියක් සඳහා 2011 වර්ෂයේ දී බදු දී තිබූ අතර 2012 – 2015 සහ 2017 – 2019 වර්ෂවල කිසිදු බදු මුදලක් අයකරගෙන නොතිබුණි. 2023.12.31 දින වන විටත් රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු වාර්තා ලබාගෙන හෝ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය මගින් වාර්තා ලබාගෙන සාධාරණ ක්‍රමවේදයකට අයකළ යුතු බදු මුදල තීරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඟ) දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි ගලිඹුරේ වත්ත කැබලි අංක 01 හි අක්කර 12 රූඩ් 02 පර්චස් 4.48 ක ප්‍රමාණය තුළ පිහිටි කළු ගල 2011 ජූලි මස බදු දී තිබුණි. 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 12 ක් පමණ ගතවන තෙක්ම අදාළ බදුකරු නියමිත පරිදි බදු නොගෙවීම සම්බන්ධව ගතයුතු ක්‍රියාමාර්ග කොමිෂන් සභාව විසින් නොගැනීම හේතුවෙන් එමගින් උපයා ගත හැකිව තිබූ ආදායමක් අහිමිවී තිබුණි.

(ච) 2023 දෙසැම්බර් 31 දින වන විට පවතින මුළු නඩු සංඛ්‍යාව 1,123 ක් වන අතර නීති වියදම් ලෙස රු.34,657,989 ක මුදලක් දරා තිබුණි.

(ඡ) 2021 වර්ෂයේදී රු. මිලියන 350 ක් වැයකර ආරම්භ කල කාබනික පොහොර ව්‍යාපෘතියේ වියදමට සාපේක්ෂව උපයාගෙන තිබුණු ආදායම රු.මිලියන 22 ක් වීම මත මෙම ව්‍යාපෘතිය අසාර්ථක ව්‍යාපෘතියක් ලෙස 2022 වර්ෂයේදී අවසන් කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා

මිලදී ගත් රු.මිලියන 31 කට වඩා අධික යන්ත්‍ර සූත්‍ර සහ කාර්යාල උපාංග ස්ථානගත කර ඇති හා එම වත්කම් වර්ග හා වටිනාකම් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොවීය. 2023 මාර්තු 28 දිනැති අමප/23/383/615/017 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් මෙම ව්‍යාපෘතිය අසාර්ථක වීමට හේතු වී ඇති කරුණු, එහි මුදල් භාවිතා කොට ඇති ආකාරය සහ ඒ සඳහා දායක වූ පාර්ශව පිළිබඳ ස්වාධීන පූර්ණ විමර්ශනයක් සිදු කිරීමට සාමාජිකයන් තුන් දෙනෙකුගෙන් යුත් විශේෂ විමර්ශන කමිටුවක් සංචාරක හා ඉඩම් අමාත්‍යාංශ ලේකම් විසින් පත්කර එම වාර්තාව 2023 අප්‍රේල් 29 දිනැති සංචාරක හා ඉඩම් අමාත්‍යාංශ ලේකම්ගේ අංක 9/2/6/17 ලිපිය මගින් සති 02 ක් තුළ ඉදිරිපත් කරන ලෙස දක්වා ඇතත් 2024 ජුනි දක්වා ඉදිරිපත් කර නොතිබුණි.

(ත) 2018 ජුනි 27 දිනැති අංක අමප/18/1126/829/002 දරන කැබිනට් තීරණය මගින් වර්ෂයක කාලයක් සඳහා නිලධාරීන් 214 දෙනෙකු බඳවා ගැනීමට අනුමැතිය ලබා දී තිබුණු අතර කාර්ය සාධනය අනුව වසර 3ක කාලයක් සඳහා එම නිලධාරීන්ගේ සේවය දීර්ඝ කළ හැකි බව එහි දක්වා තිබුණද අදාළ වසර 3 අවසන් වීමෙන් පසුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියෙන් තොරව කළමනාකරණ සහකාර 138 ක්,රියදුරු 10ක් සහ කාර්යාල සහයක 16 ක් සඳහා ස්ථිර පත්වීම් ලබාදී තිබුණි. මීට අමතරව කොමිෂන් සභා පත්‍රිකා මගින් බඳවාගෙන ඇති කළමනාකාර සහකාර තනතුරු 56 ක් හා ප්‍රාථමික තනතුරු 08 ක් සඳහාද කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ගෙන නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති